# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 89 — 1973 දෙසැම්බර් 07 වැනි සිකුරාදා — 1973.12.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# 1 වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 1221 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 1217 | මිළ පාලන දැන්වීම් ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | 1232 |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය... | 1218 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... | 1220 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 1237 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... | — |


සැලකිය යුතුයි.—පොලිස් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 555**

අංකය : ඩී/විඑප්/30 (ii).

**යුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පදවිය අත් හැරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්**

**(අ) පදවිය අත්හැරීම**—1973 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ලුතිනන්-කර්නල් ආනන්ද තෙලිකඩ පල්ලගේ, ඊඩී., ලයුසේබ, ලංකා යුද්ධ හමුදා සේවා බලකාය (ස්වේච්ඡා) හි අණදෙන නිලධාරි පදවිය අත්හරින ලදී.

**(ආ) විශ්‍රාම ගැන්වීම.**—ලුතිනන්-කර්නල් ආනන්ද තෙලිකඩ පල්ලගේ, ඊඩී., ලයුසේබ, 1973 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගෙන ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් 19 දින,
කොළඹ දී ය.

12-177—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

1217—බී 71117—10,345 (73/11)

**1973 අංක 556**

අංකය : ඩී/වී එෆ්/51/ඒ.

**යුද්ධ හමුදව— ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්/අධිකාරියට පත් කිරීමක් හා ඇතුලත් කිරීමක්**

(අ) විශ්‍රාම ගැනීම—

කපිතන් (උපකරන පාලණ) මහවිදානගේ පියසේන ගුණවර්ධන ගැහේබ 1973 නොවැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාවෙන් විශ්‍රාම ගැනීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කර තිබේ.

(ආ) අධිකාරියට පත් කිරීමක් හා ඇතුලත් කිරීමක් :—

1973 නොවැම්බර් මස 01 වැනි දින සිට පහත නම සඳහන් බලලත් නිල ධාරියා, යුද්ධ හමුදවේ ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාවේ ලුතිනන් (උප-කරණ පාලක) (පොදු රාජකාරි) වශයෙන් අධිකාරියට පත් කිරීම සහ ඔහුව 3 වැනි (ස්වේච්ඡා) බල ඇණිය, හැමුණු සේවා බලකායට ඇතුළත් කිරීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කරන ලදී.

සෙ/3 බලලත් නිලධාරි II ජෝර්ජ් වික්ටර් නානායක්කාර

උතුමාණන් වහන්සේ අණ පරිදි,

වි. ටි. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් 9 වැනි දින,
කොළඹ දී ය.

12–34—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 557**

අංකුය : ඩී/වීඑෆ්/9/ඒ (ii)

**යුද්ධ හමුදව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1973 ජනවාරි මස 01 වෙනි දින සිට කපිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරි) වශයෙන්—

ලුතිනන් (උපකරණ පාලක) සයිමන් කන්නන්ගර., ලයුසේබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 9 වැනි දින,
කොළඹ දී ය.

12–33—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**නිවැරදිකිරීමයි**

1973.8.3 වෙනි දින හා අංක 71 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 791 වෙනි පිටුවේ පලවූ අංක 377 වෙනි දැන්වීම උසස් කිරීම් යටතේ ඇති iii වැනි ඡේදය පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුයි.

"1973 මැයි මස 15 වැනි දින සිට ලුතිනන්වරුන් වශයෙන්

දෙවන ලුතිනන් සොලමන් කුනම් ඩැනියෙල් ලං. ඉ.

දෙවන ලුතිනන් රණසිංහ ආරච්චිගේ විල්සන් පෙරේරා ලං. ඉ."

8–20—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 558**

අංකය : ඩී/වීඑෆ්/18ඒ.

**ශ්‍රී ලංකා නාවික හමුදව—ස්ථිර නාවික උප සේවය—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

1973 ඔක්තෝබර් මස 31 වැනි දින සිට, ශ්‍රී ලංකා නාවික හමුදවේ ස්ථිර නාවික උප සේවයෙන් පහත සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත :—

කොමාන්ඩර් ඩී. සී. ඉංගල්ටන්, ස්ථිර නාවික උප සේවය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ දී ය.

12–32—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 559**

අංකය : ඩී/වී/එෆ්/18/ඒ (iv).

**ශ්‍රී ලංකා නාවික හමුදව—ස්ථිර නාවික උප සේවය—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

1973 නොවැම්බර් මස 01 වැනි දින සිට, ශ්‍රී ලංකා නාවික හමුදවේ ස්ථිර නාවික උප සේවයෙන් පහත සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත:—

ලුතිනන් කොමාන්ඩර් එච්. ජී. පවුලස්, ස්ථිර නාවික උප සේවය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

12–36—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 560**

අංකය : ඩී. 252/ආර්සීඑෆ්/3 (1).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් වීමක්**

1973 ජුලි 1 වැනි දින සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර්වරයෙකු වශයෙන් —

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හෝලුපතිරගේ කීර්තිරාජ් කල්දේරා (01097)—පො. රා/නියමු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 23 දින,
කොළඹ දී ය.

12-136—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 561**

අංකය : ඩී/වීඑෆ්/75.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

1973 පෙබරවාරි මස 28 වැනි දින සිට, ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම, ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත :—

ෆ්ලයිං ඔෆිසර්, හමගේ බර්නාඩ් ද සිල්වා (වී/0029)
—පාලන/රෙජිමේන්තු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 17 දින,
කොළඹ දී ය.

12–176—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

# අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය

**1973 අංක 562**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩල ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත**

1. කේ. සී. ඊ. ද අල්විස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කොළඹ දි. උ. අංක 70334/එම් දරණ නඩුව ඇසීමට සහ අසා අවසානකර තීන්දුව දීම පිණිස 1973 නොවැම්බර් මස 14 වැනි දින සිට කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

2. එල්. එච්. පී. වීරසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ අංක 261/73 දරණ හබයාස් කෝපස් නඩුව ඇසීමට සහ අසා අවසානකර තීන්දුව දීම පිණිස 1973 නොවැම්බර් මස 16 දින සිට මීගමුව අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස්තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

3. ජේ. එෆ්. ඒ. සෝසා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. එෆ්. ඩබ්ලිව්. ද සිල්වා මහතා 1973 දෙසැම්බර් මස 7 සහ 8 දිනයන් හි මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

4. ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවාහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, ටී. එෆ්. ඩබ්ලිව්. සිල්වා මහතා 1973 දෙසැම්බර් මස 7 සහ 8 යන දිනයන්හි මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

5. ආර්. ඉලෙපෙරුම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1973 නොවැම්බර් මස 9 සිට 11 දින දක්වා ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

6. ආර්. ඉලේපෙරුම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1973 නොවැම්බර් මස 5 වැනි දින ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

7. එච්. ඩබ්ලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ආර්. වික්‍රමසිංහ මහතා 1973 නොවැම්බර් මස 5 වැනි දින ගාල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

8. ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. සී. රාජරත්නම් මහතා 1973 ඔක්තෝබර් මස 18 සහ 19 දිනයන්හි හැටන්හි ක්‍රියා කරන නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

9. ඒ. බී. අඑවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ.සී. රාජරත්නම් මහතා 1973 නොවැම්බර් මස 8 වැනි දින හැටන්හි ක්‍රියා කරන නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

10. ඒ සයිමන් සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ආර්. බී. ඒ. ගුණතිලක මහතා 1973 නොවැම්බර් මස 20 සහ 21 යන දිනයන්හි කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

11. ටී. එම්. වරුසවිතාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එල්. එම්. රෂීක් මහතා 1973 නොවැම්බර් මස 8 වැනි දින හම්බන්තොට අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

12. එම්. එස්. එස්. කොරයා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ඕ. එම්. තහිර් මහතා 1973 නොවැම්බර් මස 6 සහ 7 දින යන්හි කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

13. කේ. සී. ටී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1973 නොවැම්බර් මස 5 වැනි දින හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

14. ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවක නියමයක් කරනතුරු, එස්. එම්. අබුතහිර් මහතා 1973 නොවැම්බර් මස 7 වැනි දින පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

15. ටී. පී. රත්වත්තේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. ඒ. තෙන්නකෝන් මහතා 1973 නොවැම්බර් මස 7 වැනි දින කුලියාපිටිය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට

16. ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එම්. හලල්දීන් මහතා 1973 නොවැම්බර් මස 5 සහ 6 දිනයන්හි පොළොන්නරුවේ ක්‍රියා කරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

17. ඒ. එම්. අයි. සහීඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. කේතීශ්වරන් මහතා 1973 නොවැම්බර් මස 9 දින සිට 11 දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

18. කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1973 නොවැම්බර් මස 16 වැනි දින සිට 19 වැනි දින දක්වා මන්නාරම අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

19. බී. ඩී. ප්‍රනාන්දු මහතා උසාවි අංක 16 ,16/436/69 සහ 16/641/70 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දු දීම සඳහා 1973 නොවැම්බර් මස 26, 22, 23 සහ 24 වැනි දිනයන්හි කම්කරු විනිශ්වය සභා සභාපති වරයෙකු වශයෙන් වැඩ බැලීමට.

20. එම්. ජී. එච්. ද අල්විස් මහතා කොළඹ අංක 11/1274/69, 11/ඒ/462 සිට 11/ඒ/464 දක්වා, 11/1004/69, 11/1008/69 සිට 11/1010 දක්වා, 11/258/69, 11/මා/962, 11/මා/963, 11/මා/1006, 11/මා/1007, 11/ඒ/1239, 11/1966/70, 11/1967/70, 11/ඒ/1813, 11/ආර්/3057, $\frac{11/2246/71}{11/429/69}$ දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දු දීම පිණිස 1973 නොවැම්බර් මස 15, 17, 19, 20, 21, 22, 23, 28, 29 26, 27 දිනයන්හි කම්කරු විනිශ්වය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

21. සුදර්මා ධර්මදාස මහත්මිය ඇයගේ වෙනත් රාජකාරිවලට අමතර වශයෙන් 1973 දෙසැම්බර් මස 3 වැනි දින සිට දින 15ක කාලසීමාවකට පැල්මඩුල්ලේ ගම්බද උසාවියේ අංක 9377 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

22. පී. ඩී. පී. විජේසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අමතර වශයෙන් 1973 දෙසැම්බර් මස 27 වැනි දින සිට දින (15) කාලසීමාවකට ආණමඩුව ගම්බද උසාවියේ අංක 8121 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු කඩවත් කල්පිටිය රාජවන්නි පළාත සහ කුමාරවන්නි පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ පිටිගල් කෝරලේ උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

23. කේ. එස්. ගුණතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එස්. අබ්දුල්ලා මහතා 1973 ඔක්තෝබර් මස 16 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල බිංගිරිය සහ දේවමැදි හත්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

24. එම්. එස්. අබ්දුල්ලා මහතා 1973 නොවැම්බර් මස 5, 7 සහ 19 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

25. ඒ. එස්. ඉහළගම මහතා 1973 නොවැම්බර් මස 06 වැනි දින හෝ නැවත නියමයක් කරනතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගලිගමුව නිකවැරටිය, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

26. ටී. බී. තෙලෙසිංහ මහතා 1973 නොවැම්බර් මස 1, 13, 16, 20 සහ 30 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව–නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

27. ජී. සූරියආරච්චි මහතා 1973 නොවැම්බර් මස 2, 3, 8, 9, 12, 14, 15, 17, 21, 22, 23, 24, 26, 27, 28 සහ 29 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව–නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

28. යූ. එල්. ඒ. මජීඩ් මහතා 1973 නොවැම්බර් මස 1, 2, 3, 5, 6, 7, 8, 19, 20, 21, 22, 23 සහ 24 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු, මඩකලපුව දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

29. ඒ. සී. ජබාර් මහතා 1973 නොවැම්බර් මස 12 දින සිට 17 දක්වා සහ 26 සිට 30 දින දක්වා හෝ නැවත නියමයක් කරනතුරු, මඩකලපුව දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

30. පී. ඕ. ආර්. විජේතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. ආර්. සමරජීව මෙනවිය 1973 නොවැම්බර් මස 5 සිට 9 දක්වා, 12 සිට 17 දක්වා, සහ 19 සිට 21 වැනි දින දක්වා මාතර දිස්ත්‍රික්කයේ වැල්ල බඩ පත්තු කඩවත් සතර, වැලිගම් කෝරලේ, කඳුබොඩ පත්තු සහ ගඟබොඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

31. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, උපාලි ගොඩඹුනේ මහතා 1973 නොවැම්බර් මස 12 සිට 14 දින දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

32. ජේ. ඩබ්ලිව්. බී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඇල්.බී. කරල්ලියද්ද මහතා 1973 නොවැම්බර් මස 12 සහ 13 දිනයන්හි මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර සහ උඩුදුම්බර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

33. ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. ඩබ්ලිව්. අබේසිංහ මහතා 1973 නොවැම්බර් මස 16 වැනි දින සහ 28 දින ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ බස්නාහිර සියනෑ කෝරලේ (මැදපත්තු) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත්කුරු කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

34. කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ලෝගේස්වරන් මහතා 1973 නොවැම්බර් මස 1 සිට 3 වැනි දින දක්වා ජේදුරු තුඩුව දිස්ත්‍රික්කයන්හි උතුරු වලිකාමම, නැගෙනහිර වලිකාමම වඩමරච්චි සහ යාපනය ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

35. සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. සුන්දරලිංගම් මහතා 1973 නොවැම්බර් මස 14 සිට 17 වැනි දින දක්වා ජේදුරු තුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි පච්චිලයිප්පලෙයි සහ පූනාකාරි තුන්නුකායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

36. එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ක්‍යූ. හලහකෝන් මහතා 1973 නොවැම්බර් මස 16 සහ 17 දිනයන්හි මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ උතුර ඒ සහ බී අළුත්කුරු කෝරලේ දකුණ සහ සියනෑ කෝරලේ බස්නාහිර (අධිකාරි පත්තු) ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

37. එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1973 ඔක්තෝබර් මස 30 සහ 31 වැනි දිනයන්හි වවුනියා සහ යාපනය දිස්ත්‍රික්කයන්හි උතුරු වවුනියාවේ සහ මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති සහ පූනාකාරි සහ තුන්නුකායි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

38. එෆ්. ජී. බී. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1973 නොවැම්බර් මස 28 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ ගහබොඩ පත්තු සහ හිනිදුම පත්තු සතර පේරුව හා කල්පේපත්තු ගම්බද උසාවි සභාපති සහ වැල්ලබඩ පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

39. ඩී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. රණතුංග මහතා 1973 නොවැම්බර් මස 6 වැනි දින කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිනිගොඩ, බෙලිගල් සහ පරනකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

40. එම්. එම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. එල්. ද සිල්වා මෙනවිය 1973 නොවැම්බර් මස 2, 3 සහ 7 වැනි දිනයන්හි පානදුර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලය සහ පානදුර කොටමුන ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

41. ජී. එස්. වත්තෙගෙදර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එස්. ඉහලගම මහතා 1973 නොවැම්බර් මස 17 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ විල්ලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තු වේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

42. කේ. ජේ. ජස්ටින් පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. කරුණාරත්න මහතා 1973 නොවැම්බර් මස 19 සහ 20 වැනි දිනයන්හි අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ පහල බුලත්ගම, අටළුගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

43. ඉසෙඩ්. ඒ. එම්. තාසීම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 7508, 7679, 906/ටී, 7602, 7603, 7574, 7575, 7576, 7577 සහ 7578 දරණ නඩු ඇසීමට හා අසා නිම කර තීන්දුදීමට 1973 නොවැම්බර් මස 22 දින සිට දින පහළොහක (15) කාලසීමාවක් සඳහා උතුරු කොළඹ අතිරේක කාතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

44. ටී. පී. පස්සල මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1973 නොවැම්බර් මස 16 වැනි දින සිට තවදුරටත් දින පහළොවක කාල පරිච්ඡෙදයක් සඳහා බදුල්ලේ පරිපාලන දිස්ත්‍රික්කයේ කාතිවරයා වශයෙන් වැඩ බැලීමට.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. අංක 573,
1973 නොවැම්බර් මස 23 වැනි දින,
ශී. 52, කැප්පෙටිපොල පාර, කොළඹ 5 දී ය.

12-9—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

# වෙනත් පත් කිරීම් ආදිය

**1973 අංක 563**

අංකය : ඩී. 251/ආර්.සීපී/1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—නිලධාරීන් ස්ථිර කිරීම**

1973 ජූලි මස 01 දින සිට උප ලුතිනන් වරු වශයෙන් :—
වැඩබලන උප ලුතිනන් සී. ඒ. එම්. ජයමහ ශ්‍රී ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් එච්. සී. ඒ. සී. තිසේරා ශ්‍රී ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් ඩී. කේ. දසනායක ශ්‍රී ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් සී. ඩබ්ලිව්. සඳසිරි ශ්‍රී ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් එන්. ඩබ්. මුසාෆර් ශ්‍රී ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් එච්. ආර්. අමරවීර ශ්‍රී ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් ටී. ඉසෙඩ්. බාගුස් ශ්‍රී ලං.නා.හ.

1973 ජූලි මස 01 දින සිට උප ලුතිනන් (ඉ) වශයෙන් :—
වැඩබලන උප ලුතිනන් (ඉ) එල්. පී. ආර්. මැන්දිස් ශ්‍රී.ලං.නා.හ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 14 දින,
කොළඹ දී ය.

12-135—1973.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

**1973 අංක 564**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

වේයන්ගොඩ වල්ගම්මුල්ලේ පදිංචි දෙන් එඩ්වින් නාලවත්ත අභයසිංහ මහතා කිරිදිවැල ප්‍රධාන කාර්යාලය වල්ගම්මුල්ල අතුරු කාර්යාලය ද ඇතුව ගම්පහ අධිකරණ කොට්ඨාශය ද අතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍යපරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

සී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 දින,
කොළඹ දී ය.

12–243—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 565**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

යාපනයේ 3 වෙනි හරස් වීදියේ අංක 44 හි පදිංචි එලයතම්බි සිවරත්නම් මහතා යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 දින,
කොළඹ දී ය.

12–246—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

1973 අංක 566

නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

පල්ලේබැද්දේ රංවල පාරේ "මිහිර" නිවසේ පදිංචි බුද්ධදස විතානගේ මහතා රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 දින,
කොළඹ දී ය.

12-248—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

රා. ආ. වි./ලේ ඊ/පී 20/74(60)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ වාන් ඇල පිහිටුවන ලද පොලිස් මුරපොල, පොලිස් ස්ථානයක් බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1973 නොවැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

12-39/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

රා. ආ. වි./ලේ.—ඊ/පී 20/74 (60)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට ජාතික නිවාඩු නිකේතනය තුල පිහිටුවන ලද පොලිස් මුරපොල, පොලිස් ස්ථානයක් බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1973 නොවැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

12-39/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

රා. ආ. වි/ලේ.—ඊ/පී 20/74 (60)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පුගොඩ පිහිටුවන ලද පොලිස් මුරපොල, පොලිස් ස්ථානයක් බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1973 නොවැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

12-39/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

රා. ආ. වි./ලේ.—ඊ/පී 20/74 (60)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලියේ පිහිටුවන ලද පොලිස් මුරපොල, පොලිස් ස්ථානයක බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1973 නොවැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

12-39/4—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

රා. ආ. වි./ලේ—ඊ/පී 20/74 (60)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කයේ මාන්කුලමේ පිහිටුවන ලදපොලිස් මුරපොල, පොලිස් ස්ථානයක් බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරනලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1973 නොවැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

12-39/5—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

රා. ආ. වි./ලේ—ඊ/පී 20/74 (60)

**අපරාධ නඩු විධාන සංග්‍රහය—2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මුරුන්කන්හි පිහිටුවන ලද පොලිස් මුරපොල, පොලිස් ස්ථානයක් බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1973 නොවැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

12-39/6—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥපනත

1964 අංක 44 හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නැව් කටයුතු හා සංචාරක කටයුතු භාර ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥවයි.

පී. බී. ජී. කලුගල්ල,
නැව් හා සංචාරක කටයුතු පිළිබඳ ඇමති.

1973 නොවැම්බර් 09 වැනි දින,
කොළඹ දී ය.

#### ආඥව

මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් රජයේ ඉඩම් ප්‍රදේශය 1964 අංක 44 හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥපනතේ කාර්යයන් සඳහා ජාතික රක්ෂිත භූමියක් විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

2. ඉහත කී මුළු ජාතික රක්ෂිත භූමියම ඉහත කී ආඥපනතේ කාර්යයන් සඳහා ජාතික උද්‍යානයක් විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

#### උපලේඛනය

විල්පත්තු ජාතික වනෝද්‍යානය—කැබලි අංක V

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු සහ මායිම් ආදායම් පාලක කොට්ඨාශයේ පොම්පරිප්පු පත්තුවේ අංක 634 පුක්කුලම් හා අංක 635 පොම්පරිප්පු ග්‍රාම සේවක කොට්ඨාශයන්හි පිහිටියාවූ ද, අංක 12 දරණ මූලික භූ-ලක්ෂණ සැලැස්මේ අංක 9 දරණ අන්තර් සිතියමේ කැබලි අංක 16 (පලුගතුරෙයි ගම), අංක 10, 11 සහ 12 දරණ අන්තර් සිතියම් හි කැබලි අංක 17 සිට 74 දක්වා (පුක්කුලම් ගම) සහ අංක 25 දරණ මූලික භූ-ලක්ෂණ සැලැස්මේ අංක 1 දරණ අන්තර් සිතියමේ කැබලි අංක 2 සහ 3 (වෙල්ල මුන්දල් ගම) හැරුණු විට ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අක්කර 53,090 ක් වූද, පහත සඳහන් පරිදි මායිම්ව ඇත්තා වූ ද මුළු බිම් ප්‍රදේශය.

උතුරට : අංක 12 දරණ මූලික භූ-ලක්ෂණ සැලැස්මේ වයඹ කොණ ලෙස දක්වා ඇති කුදිරමලෙයි ලක්ෂ්‍යයෙන් පටන් ගැනෙන රේඛාවෙන්, එකී සැලැස්මේ උතුරු මායිම වූ මුහුද ඔස්සේ අප්පු ආරු පුනීල මෝය හමුවන තෙක් සාමාන්‍ය වශයෙන් ඊසාන දිසාවට ද, එතැන් සිට පුත්තලමේ සිට මන්නාරම දක්වා ඇති මාර්ගය හමුවන තෙක් එකී ගංගාවේ වම් ඉවුර ඔස්සේ සාමාන්‍ය වශයෙන් නැගෙනහිර දිසාවට.

නැගෙනහිරට : තල විල්ලු දක්වා මාර්ගය හමුවන තෙක්, අංක 12 මූලික භූ-ලක්ෂණ සැලැස්මේ නැගෙනහිර මායිම වූද, පුත්තලම සිට මන්නාරම දක්වා මාර්ගය ඔස්සේ පෙර සඳහන් ලක්ෂ්‍යයෙන්, පටන්ගැනෙන රේඛාවෙන් සාමාන්‍ය වශයෙන් නිරිත දෙසට ද, එතැන් සිට අංක 3 දරණ අවසාන භූ-ලක්ෂණ මූලික සටහනේ දකුණු මායිම වූද, විල්පත්තු ජාතික වනෝද්‍යානයේ කැබලි අංක 2 උතුරු මායිම හමුවන තෙක් පෙර කී තල විල්ලු දක්වා මාර්ගය ඔස්සේ සැතපුම් 13/4 ක් පමණ සාමාන්‍ය වශයෙන් ඊසාන දෙසට ද සැතපුම් 1 ක් පමණ ගිණිකොණ දෙසට ද, එතැන් සිට ඉම් ගල් තබන ලද විල්පත්තු දකුණු අන්තර් කලාපීය සීමාව වූද අංක 25 දරණ මූලික භූ-ලක්ෂණ සැලැස්මේ නැගෙනහිර මායිම හමුවන තෙක් දම්වැල් 35 ක් පමණ බටහිර දෙසට ද, එතැන් සිට උත්ත මදු ආරු හමුවන තෙක් අංක 25 දරණ මූලික භූ-ලක්ෂණ සැලැස්මේ පෙර කී බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට ද, එතැන් සිට කලාඔය දක්වා පෙර කී ගංගාවේ දකුණු ඉවුර ඔස්සේ දකුණු දෙසට.

දකුණට : කරුසඩි ආරු හමුවන තෙක් කලාඔය වම් ඉවුර ඔස්සේ, පසු කී ලක්ෂ්‍යයෙන් පටන් ගැනෙන රේඛාවෙන් සාමාන්‍ය වශයෙන් බටහිර දෙසට ද, එතැන් සිට විල්පත්තු බටහිර අභය භූමියේ නැගෙනහිර මායිම වූද ගංගාව හමුවන තෙක් කලාඔය ඔස්සේ සාමාන්‍ය වශයෙන් වයඹ දෙසට ද එතැන් සිට කල් ආරු හමුවන තෙක් පෙර කී ගංගාව ඔස්සේ සාමාන්‍ය වශයෙන් නිරිත දෙසටද එතැන් සිට මුහුදු වෙරළ හමුවන තෙක් එකී කල් ආරු ඔස්සේ වයඹ දෙසට.

බටහිරට : ආරම්භක ලක්ෂ්‍යය (කුදිරමලෝ) හමුවන තෙක් මුහුදු වෙරළ ඔස්සේ, පසු කී ලක්ෂ්‍යයෙන් පටන්ගැනෙන රේඛාවෙන උතුරු දෙසට.

12–2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥපනත

1964 අංක 44 හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නැව් කටයුතු හා සංචාරක කටයුතු භාර ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥවයි

පී. බී. ජී. කලුගල්ල,
නැව් හා සංචාරක කටයුතු පිළිබඳ ඇමති.

1973.11.23 කොළඹ දීය.

#### ආඥව

මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් රජයේ ඉඩම් ප්‍රදේශය 1964 අංක 44 හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥපනතේ කාර්යයන් සඳහා ජාතික රක්ෂිත භූමියක් විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

2. ඉහත කී මුළු ජාතික රක්ෂිත භූමියම ඉහත කී ආඥපනතේ කාර්යයන් සඳහා ජාතික උද්‍යානයක් විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුවේ පිහිටියාවූ ද, මුළු ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අක්කර 530 ක් වූද, පහත සඳහන් පරිදි මායිම්ව ඇත්තාවූද සියලුම ඉඩම් ප්‍රදේශය.

උතුරට : අංක 5 එස්. පී. අවසාන භූ ලක්ෂණ සැලැස්මේ කැබැලි අංක 40 බටහිර මායිම හමුවන තෙක්, යෝධ කණ්ඩිය-සිතුල්පහුව මාර්ගය බෝම්බෝව ආර හරහා වැටී ඇති ලක්ෂ්‍යයෙන් අඳින ලද රේඛාවෙන් එකී මාර්ගය ඔස්සේ සාමාන්‍ය වශයෙන් ඊසාන දෙසට ;

නැගෙනහිරට : අංක. 5 එස්. පී. අවසාන භූ ලක්ෂණ සැලැස්මේ පෙර කී කැබලි අංක 40 හි පෙර කී මායිම වූ රුහුණු ජාතික වනෝද්‍යානයේ පවත්නා මායිම ඔස්සේ ර්දවැදිය ආර හමුවන තෙක්, අවසන් වරට කී ලක්ෂ්‍යයේ සිට අඳින ලද රේඛාවෙන් දකුණු දෙසට ද, එතැන් සිට යාල පලටුපාන මාර්ගය හමුවන තෙක් එකී ආර ඔස්සේ සාමාන්‍යයෙන් ගිණිකොණ දෙසටද, එතැන් සිට කිරින්ද දෙසට වැටී ඇති මාර්ගය හමුවන පරිදි පලටුපාන හංදිය දක්වා බටහිර දෙසට ද එතැන් සිට එම රේඛාව හා බොම්බෝව ආර ඡේදනය වන ලක්ෂ්‍යය හමුවන තෙක් පලටුපාන-කිරින්ද මාර්ගය ඔස්සේ සාමාන්‍ය වශයෙන් දකුණු දෙසට ;

දකුණට : පලටුපාන වැවෙන් ආසන්න වශයෙන් දම්වැල් 4 ක් නිරිත දෙසදී බොම්බෝව ආර වෙල්ල හමුවන පරිදි, අවසන් වරට කී ලක්ෂ්‍යයෙන් ඇඳි සෘජු රේඛාවෙන් බටහිර දෙසට ද, එතැන් සිට තිස්ස මහාරාමයේ සිට යාල දක්වා වැටී ඇති මාර්ගය වූත්, අංක. 5 එස්. පී. අවසාන භූ ලක්ෂණ සැලැස්මේ කැබැලි අංක. 8 හි බටහිර මායිම හමුවන තෙක් බොම්බෝව ආර ඔස්සේ බටහිර දෙසට ;

බටහිරට : මෙකී භූමි ප්‍රදේශයේ උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය වූද, යෝධ කණ්ඩිය-සිතුල්පහුව මාර්ගය හමුවන තෙක් බොම්බෝව ආර ඔස්සේ අවසන් වරට කී ලක්ෂ්‍යයෙන් වයඹ දෙසට.

12–134—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව—1972

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන ඇමතිතුමා විසින් කෙරෙන නියෝගය—රාජ්‍ය නිලධාරීන් පත්කිරීම

#### නියෝග අංක 1

ප්‍රවාහණ ඇමති ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වැනි වගන්තිය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව යට දක්වෙන කොන්දේසිවලට යටත්ව මෙම උපලේඛනයේ II වැනි තීරුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති රාජ්‍ය නිලධාරියාට එම උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති දෙපාර්තමේන්තුවල වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සියළුම රාජ්‍ය නිලධාරීන් (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) පත් කිරීමේ බලය මෙයින් පවරමි :—

(අ) මෙම බලතල අමාත්‍ය මණ්ඩලය මගින් හෝ රාජ්‍ය පරිපාලනය භාර ඇමති විසින් හෝ ම විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි උපදෙස් ප්‍රකාර ක්‍රියාත්මක කෙරෙනු ඇත.

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වැනි වගන්තිය ප්‍රකාර එබඳු නිලධාරියකුට පවරන ලද පරිදි වූ පත් කිරීමේ බලතල මා විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි මා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවේදී, එබඳු නිලධාරියකු විසින් එම බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

උපලේඛනය

| I | II |
|---|---|
| ප්‍රවාහන අමාත්‍යාංශය ... ... ... ... ... | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| දුම්රිය දෙපාර්තමේන්තුව ... ... ... ... ... | සාමාන්‍යාධිකාරී, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව ... ... ... ... | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ... ... ... ... | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් |

12–49/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව—1972

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය යටතේ ප්‍රවාහණ ඇමතිතුමා විසින් කෙරෙන නියෝගය—රාජ්‍ය නිලධාරීන්ගේ සේවයෙන් පහ කිරීම හා විනයපාලනය

### නියෝග අංක 2

ප්‍රවාහණ ඇමති ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව යට දක්වෙන කොන්දේසිවලට යටත් වූ මෙම උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේ රාජ්‍ය නිලධාරියාට හෝ නිලධාරීන්ට, එම උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති බලතල මෙයින් පවරමි :—

(අ) මෙම බලතල අමාත්‍ය මණ්ඩලය මගින් හෝ රාජ්‍ය පරිපාලනය භාර ඇමති විසින් හෝ ම විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි උපදෙස් ප්‍රකාර ක්‍රියාත්මක කෙරෙනු ඇත.

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාර එබඳු නිලධාරියකුට පවරන ලද පරිදි වූ දඬුවම් පැමිණවීමේ බලතල මා විසින් ක්‍රියාත්මක කළ යුතුයැයි මා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවේ දී, එබඳු නිලධාරියකු විසින් එම බලතල ක්‍රියාත්මක නොකළ යුතුය.

2. මා විසින් පවරා දෙනු ලැබූ බලතල යටතේ කරන ලද සේවයෙන් පහ කිරීමේ නියෝගයක් ඇතුළු විනයානුකූල කාරණයකට අදල කිසියම් නියෝගයක් මගින් අසහනයකට පත් රාජ්‍ය නිලධාරියකුට ඒ පිළිබඳව ව්‍යවස්ථාවේ 119 (2) වන වගන්තිය ප්‍රකාර රාජ්‍ය සේවා විනය මණ්ඩලයට හෝ 119 (3) වගන්තිය යටතේ අවශ්‍ය විය හැකි පරිදි මා වෙත හෝ අභියාචනය කළ හැකි ය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

උපලේඛනය

| I | II |
|---|---|
| (1) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේ ඕනෑම රාජ්‍ය නිලධාරියකු ගේ (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) වැඩ තහනම් කිරීමේ හෝ වැඩ නැවැත්වීමේ, තරවටු කිරීමේ සතියක් වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ එක් වර්ෂයක කාල පරිච්ඡෙදයක් නොඉක්ම වන සේ වැටුප් වර්ධනය අත් හිටුවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ හෝ පමා කිරීමේ බලතල | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| (2) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේ ඕනෑම රාජ්‍ය නිලධාරියකු (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) සේවයෙන් පහ කිරීමේ සේවය අත්හිටුවීමේ හෝ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගැන්වීමේ බලතල | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |

12–49/2 — 73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව—1972

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය යටතේ ප්‍රවාහණ ඇමතිතුමා විසින් කෙරෙන නියෝගය—රාජ්‍ය නිලධාරීන්ගේ සේවයෙන් පහ කිරීම හා විනයපාලනය

### නියෝග අංක 3

ප්‍රවාහණ ඇමති ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව යට දක්වෙන කොන්දේසිවලට යටත් වූ මෙම උපලේඛනයේ II වැනි තීරුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරියාට හෝ නිලධාරීන්ට, එම උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති බලතල මෙයින් පවරමි :—

(අ) මෙම බලතල අමාත්‍ය මණ්ඩලය මගින් හෝ රාජ්‍ය පරිපාලනය භාර ඇමති විසින් හෝ ම විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි උපදෙස් ප්‍රකාර ක්‍රියාත්මක කෙරෙනු ඇත.

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාර එබඳු නිලධාරියකුට පවරන ලද පරිදි වූ දඬුවම් පැමිණවීමේ බලතල මා විසින් ක්‍රියාත්මක කළ යුතු යයි මා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවේ දී, එබඳු නිලධාරියකු විසින් එම බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

2. මා විසින් පවරා දෙනු ලැබූ බලතල යටතේ කරන ලද සේවයෙන් පහ කිරීමේ නියෝගයක් ඇතුළු විනයානුකූල කාරණයකට අදල කිසියම් නියෝගයක් මගින් අසහනයකට පත් රාජ්‍ය නිලධාරියකුට ඒ පිළිබඳව ව්‍යවස්ථාවේ 119 (2) වගන්තිය ප්‍රකාර රාජ්‍ය සේවා විනය මණ්ඩලයට හෝ 119 (3) වගන්තිය යටතේ අවශ්‍ය විය හැකි පරිදි මා වෙත හෝ අභියාචනය කළ හැකි ය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහණ ඇමති.

### උපලේඛනය

| I | II |
| --- | --- |
| (1) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ඕනෑම රාජ්‍ය නිලධාරියකුගේ (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) වැඩ තහනම් කිරීමේ හෝ වැඩ නැවැත්වීමේ, තරවටු කිරීමේ සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ එක් වර්ෂයක කාල පරිච්ඡේදයක් නොඉක්ම වන සේ වැටුප් වර්ධකය අත් හිටුවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ හෝ පමා කිරීමේ බලතල | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ |
| (2) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ඕනෑම රාජ්‍ය නිලධාරියකු (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) සේවයෙන් පහ කිරීමේ සේවය අත්හිටුවීමේ හෝ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගැන්වීමේ බලතල | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ |
| (3) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ඕනෑම රාජ්‍ය නිලධාරියකු (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) සම්බන්ධයෙන් තරවටු කිරීමේ හෝ සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ බලතල | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ |
| (4) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් තොටුපල කොමඩාන්ඩ්තැනගේ සංවිධානාත්මක පාලනය යටතට අයත්වන ඕනෑම රාජ්‍ය නිලධාරියකුට (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) තරවටු කිරීමේ, සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ බලතල | ගුවන් තොටුපල කොමඩාන්ට් |
| (5) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සංඥ නිලධාරීතැනගේ සංවිධානාත්මක පාලනය යටතට කෙළින්ම අයත්වන ඕනෑම රාජ්‍ය නිලධාරියකුට (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) තරවටු කිරීමේ, සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ බලතල | ප්‍රධාන සංඥ නිලධාරි |
| (6) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි ඉංජිනේරු තැනගේ සංවිධානාත්මක පාලනය යටතට කෙළින්ම අයත්වන ඕනෑම රාජ්‍ය නිලධාරියකුට (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) තරවටු කිරීමේ, සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ බලතල | ගුවන් විදුලි ඉංජිනේරු |
| (7) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගිනි නිවන නිලධාරි තැනගේ සංවිධානාත්මක පාලනය යටතට කෙළින්ම අයත් වන ඕනෑම රාජ්‍ය නිලධාරියකු (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) තරවටු කිරීමේ, සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ කිරීමේ බලතල | ප්‍රධාන ගිනි නිවන නිලධාරි |
| (8) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගුවන් ගමනාගමන පාලක තැනගේ සංවිධානාත්මක පාලනය යටතට කෙළින්ම අයත්වන ඕනෑම රාජ්‍ය නිලධාරියකුට (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) තරවටු කිරීමේ, සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ බලතල | ප්‍රධාන ගුවන් ගමනාගමන පාලක |

12–49/3—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව—1972

### ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය යටතේ ප්‍රවාහණ ඇමතිතුමා විසින් කෙරෙන නියෝගය—රාජ්‍ය නිලධාරීන්ගේ සේවයෙන් පහ කිරීම හා විනයපාලනය

### නියෝග අංක 4

ප්‍රවාහණ ඇමති ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව යට දක්වෙන කොන්දේසිවලට යටත් වූ මෙම උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරියාට හෝ නිලධාරීන්ට, එම උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති බලතල මෙයින් පවරමි :—

(අ) මෙම බලතල අමාත්‍ය මණ්ඩලය මගින් හෝ රාජ්‍ය පරිපාලනය භාර ඇමති විසින් හෝ ම විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි උපදෙස් ප්‍රකාර ක්‍රියාත්මක කෙරෙනු ඇත.

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය ප්‍රකාර එබඳු නිලධාරියකුට පවරන ලද පරිදි වූ දඬුවම් පැමිණවීමේ බලතල මා විසින් ක්‍රියාත්මක කළ යුතු යයි මා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවේ දී, එබඳු නිලධාරියකු විසින් එම බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

2. මා විසින් පවරා දෙනු ලැබූ බලතල යටතේ කරන ලද සේවයෙන් පහ කිරීමේ නියෝගයක් ඇතුළු විනයානුකූල කාරණයකට අදල කිසියම් නියෝගයක් මගින් අසහනයකට පත් රාජ්‍ය නිලධාරියකුට ඒ පිළිබඳව ව්‍යවස්ථාවේ 119 (2) වගන්තිය ප්‍රකාර රාජ්‍ය සේවා විනය මණ්ඩලයට හෝ 119 (3) වගන්තිය යටතේ අවශ්‍ය විය හැකි පරිදි මා වෙත හෝ අභියාචනය කළ හැකි ය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහණ ඇමති.

### උපලේඛනය

| I | II |
| --- | --- |
| (1) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ ඕනෑම රාජ්‍ය නිලධාරියකුගේ (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) වැඩ තහනම් කිරීමේ හෝ වැඩ නැවැත්වීමේ, තරවටු කිරීමේ සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ එක් වර්ෂයක කාල පරිච්ඡේදයක් නොඉක්ම වන සේ වැටුප් වර්ධකය අත්හිටුවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ හෝ පමා කිරීමේ බලතල | මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් |
| (2) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ ඕනෑම රාජ්‍ය නිලධාරියකු (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) සේවයෙන් පහ කිරීමේ සේවය අත්හිටුවීමේ හෝ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගැන්වීමේ බලතල | මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් |
| 3) වර්ෂයකට රු. 6,720 ට අඩු ආරම්භක ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ ඕනෑම රාජ්‍ය නිලධාරියකු සම්බන්ධයෙන් (ඒකාබද්ධ සේවාවන් කිසිවක නිලධාරියකු හැර) තරවටු කිරීමේ හෝ සතියක වැටුප් ප්‍රමාණය නොඉක්මවන දඩයක් නියම කිරීමේ බලතල | නියෝජ්‍ය මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් |

12–49/4—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

**49 ඡෙදය යටතේ සහතිකය**

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

සාපාශා/අත්පුඉ/131
1973 නොවැම්බර් මස 19 දින,
කොළඹ දීය.

උප ලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ, තිඹිරිගස්යාය ග්‍රාමසේවක කොට්ඨාශයේ බම්බලපිටියේ හාලු පාරේ වරිපනම් අංක 246 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 70 ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : මෙල්බොන් මාවත ;

නැගෙනහිරට : හාලුපාර ;

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;

බස්නාහිරට : ව. අංක 15, 15 1/1 මෙල්බෝන් මාවත.

12–103—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සමිති ආඥාපනත**

(123 අධිකාරය වන) සමිති ආඥාපනතෙහි 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම මේ නිවේදනයෙන්—

(1) "කළම්බු යන්ග් විමෙන්ස් හින්දු ඇසෝසියේෂන්" නමින් යුතු සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථය ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළයුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි. තවද,

(2) ඒ ආඥාපනතෙහි 5(4) වන වගන්තියේ විධි විධානවලින් එකී සමිතිය නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාල කිරීම එකී සමිතියට සීමා කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1973 නොවැම්බර් මස 24 දින,
කොළඹදී ය.

12–65—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය නැවත සකස් කිරීම**

ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් 1973 ඔක්තෝබර් මස 12 වන දින අංක 81 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ 2 (ආ) ඡේදය යටතේ දක්වා ඇති "කොට්ඨාශ අංක 709—කොහුකුඹුර" යන්න 'කොට්ඨාශ අංක 109—කොහුකුඹුර' යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

12–4—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**වර්ෂ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් ආඥාපනත**

ආයාචනා විනිශ්චය සභාව පත් කිරීම

වර්ෂ 1958 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 11,573 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1958 සේවක අර්ථසාධක අරමුදල් රෙගුලාසි මාලාවේ 47 වැනි රෙගුලාසියෙන් කම්කරු ඇමැතිතුමා වෙත පැවරුණු බලය පිට මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම—

(ඒ) මෙයට යාවෙන උපලේඛනයෙහි නියමිත පුද්ගලයන් වර්ෂ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 29 වැනි වගන්තියෙහි සඳහන් ආයාචනා විනිශ්චය සභාවෙහි සාමාජිකයින් ලෙස 1973 නොවැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන සේ මෙයින් පත් කරමි. තවද,

(බී) ආයාචනා විනිශ්චය සභාවේ සාමාජිකයෙකු වන එයුජින් රෙජිනෝල්ඩ් ද පොන්සේකා, එහි සභාපති වශයෙන් ද මෙයින් නම් කරමි.

ඇම්. පී. ද ඉසඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 නොවැම්බර් මස 22 වැනි දින,
කම්කරු මහ ලේකම් ගොඩනැගිල්ල,
නාරාහේන්පිට, කොළඹ 5.

උපලේඛනය

(1) එයුජින් රෙජිනෝල්ඩ් ද පොන්සේකා
(2) ඔර්ටි කොස්වත්ත
(3) ජෙරාඩ් ඉවාන් අමරසිංහ
(4) හැරි සමරනායක
(5) දළුවැල්ලේ ගුරුකන්දෙගේ දයාරත්න.

12–8—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**උප්පැන්න හා මරණ ලියාපදිංචිකිරීමේ පනත**

5 වන වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම්, 1935 සැප්තැම්බර් 20 වැනි දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහි වූ උපලේඛනයෙහි "උතුරු මැද පළාත—අනුරාධපුර දිස්ත්‍රික්කය" යන ශීර්ෂය යටතේ :—

(1) උතුරු උලගල්ල කෝරලේ කොට්ඨාශයට අදාල අංක 23 දරණ විෂය වෙනුවට මෙහි වූ "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් හා,

(2) අංක 23 දරන විෂයට ඉක්බිතිවම මෙහි "ආ" උපලේඛනයේ සඳහන් 23අ දරන අළුත් විෂය ඇතුලත් කිරීමෙන්,

1973 දෙසැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

1973 නොවැම්බර් මස 14 දින,
කොළඹ දීය.

"අ" උපලේඛනය

23—පහත සඳහන් ගම්වලින් සමන්විත තිරප්පනේ කොට්ඨාශය :—

| | |
|---|---|
| අළුත බැඳි වැව | බ්‍රාහ්මනයාගම |
| අළුත් තිලක පට්ටිය | දෙමටගම |
| අන්දර වැව | ඇතාවැටුන වැව |
| බොර වැව | ගොඩුමරදන් කුලම් |

ගොලුපෙන්තා වැව
ගුලුපෙන්ත වැව
හබකුඩා වැව
හම්මිල්ලකුලම
හතරැස් වැව
හින්මාවත වැව
ඉහලකෝන්ගස් වැව
ඉහලමාවත වැව
කරුවලගස් වැව
කොන්තනායන්කුලම
කුඩාගම
කුඩාවැව
කුන්චිකුලම
කුසව
මාරාකුලම
නාච්චාදූව
නීලක්පට්ටිය
පහලකෝන්ගස් වැව

පහලවාවත වැව
පලයාකුලම
පාන්ඩියන්කුලම
පට්ටිකුලම
පෙරිමියන්කුලම
පුලියන්කුලම
පුන්චිකුලම
සෙලෙස්තිමඩුව
සෙම්බුකුලම
කම්මැන්නාගොඩ වැව
තරනගොල්ලෑව
තෝඩාමඩුව
තිරප්පනේ
තිත්තයාගම
උක්කුලන්කුලම
වීරප්පූඩිකුලම
වෙල්ලමුදාව
මෙට්ටන්කුලම

## "ආ" උපලේඛනය

23 අ—පහත සඳහන් ගම්වලින් සමන්විත උට්ටිමඩුව කොට්ඨාශය :—

අලපත්වැව
අළුත් ගම
අළුත්වැව
අමනක්කට්ටුව
බැරඩියාගම
බොරවැව

දෙමටවැව
දෙමටවැව කුඩාවැව
ඇලපත්වැව
ඒරුවැව
ඇටවීර වැව
ගලපිටවැව

ගල්කන්දේගම
ගල්කුලම
ගල්කුලම කඩවීදිය
ගල්වඩුවාගම
ගැටලාගම
ඥානික්කුලම
ඉහලගලපිට වැව
ඉහලගල්කුලම
ඉහලහිඟුරු වැව
ඉහලපුලියන්කුලම
ඉහල වත්තේ වැව
ඉහල වැව
ඉර හඳ කොටු වැව
කදුරුගස්පිටිය
කරුවලගස් වැව
කටුකැලියාව
කිරින්දේගම
කෝන් වැව
කොලොන්ගස් වැව
කුඩාගම
කුඩාකනුමුල්ල
කුඩා සියඹලෑව
කුඩාවැව
කුරුපයියාව
කුරුන්දන්කුලම
කුට්ටිකුලම
මෙනැලැගම

මයිලගස්වැව
මාවතවැව
මීගස්වැව
මැකිච්චාව
මූරියාකඩවල
නබඩවැව
නිරාවිය
නිකවැව
ඔරුක්මාන්කුලම
පඩිකෙටුවැව
පහලගල්කුලම
පසිරිමඩුව
පලුකුට්ටියාව
පෙරියකුලම
පුදුක්කුලම
පුලියන්කුලම
රඹාවැව
සන්දනන් කුට්ටිගම
සියඹලෑව
සෝලයන්කුලම
තලයාගම
තම්මැන්නාගම
තරනගොල්ලෑව
උඟරාකොටේ
උට්ටිමඩුව
වන්නක්කුලම

12-106—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## 1958 අංක 12 දරණ තේ ආධාර පනත

1961 අංක 66 දරණ පනතින් ද, 1966 අංක 33 දරණ පනතින් ද, 1970 අංක 4 දරණ පනතින් ද සංශෝධිත 1958 අංක 12 දරණ තේ ආධාර පනතේ 10 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත ඇමතිවරයා විසින් පනවන ලද නියෝග.

කොල්වින් ආර් ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1973 නොවැම්බර් 12 වැනි දින,
කොළඹදීය.

### නියෝග

1. මෙම නියෝග 1973 තේ ආධාර නියෝග යනුවෙන් හැඳින්විය හැකි අතර, 1973 නොවැම්බර් 3 වැනි දින සිට ක්‍රියාත්මක වෙයි.

2. යම් තේ වත්තක හෝ කුඩා තේ ඉඩමක හෝ තේ කර්මාන්ත ශාලාවක හෝ අයිතිකරුවෙකු විසින් ආධාර ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් කළහොත්, මෙම නියෝගයන්හි විධිවිධාන අනුව තේ පාලක විසින් පහත සඳහන් කාර්යයන් සඳහා එම අයිතිකරුට තේ ආධාර අරමුදලින් ආධාර මුදලක් ගෙවිය හැකිය—

(අ) එවැනි තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් මුළුමනින්ම හෝ එහි නියමිත කොටසක් හෝ රිකිලි මගින් වර්ධනය කළ තේ පැල යොදා නැවත වගා කිරීම සඳහා;

(ආ) එවැනි තේ වත්තකට හෝ කුඩා තේ ඉඩමකට මුළුමනින්ම හෝ එහි නියමිත කොටසකට හෝ පෝර යෙදීම සඳහා;

(ඇ) තේ පාලක විසින් අනුමත කරන ලද පෙට්ටි හෝ වෙනත් ඇසුරුම් ද්‍රව්‍යයක හෝ එවැනි තේ කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන ලද තේ ඇසිරීම සඳහා,

3. 2 වැනි නියෝගය යටතේ ආධාර මුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන සෑම ඉල්ලීමක්ම තේ පාලක විසින් එම කාර්යය සඳහා වරින්වර නියම කරනු ලබන ආකෘතියකට අනුකූලව ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය.

4. (1) 1973 නොවැම්බර් 03 වැනි දින හෝ ඊට පසුව හෝ නිකුත් කළ නැවත වගා අවසර පත්‍ර පිට රිකිලි මගින් වර්ධනය කළ තේ පැල යොදා තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් මුළුමනින්ම හෝ එහි නියමිත කොටසක් හෝ නැවත වගා කිරීම සඳහා ගෙවිය හැකි ආධාර මුදල, එසේ නැවත වගා කිරීමට ඇති සෑම අක්කරය කටම රු. 4,750 විය යුතු අතර, එම මුදල පහත සඳහන් පරිදි, කොටස් හතකින් ගෙවිය හැක :—

(අ) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි තිබෙන තේ පඳුරු හෝ වෙනත් වගාවන් උදුරා ඉවත් කිරීමෙන් අනතුරුව සෑම අක්කරයකටම රු. 500 බැගින් වන ආධාර මුදලේ පළමුවැනි කොටස ගෙවිය හැක;

(ආ) තේ පාලක විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළදී නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි පස සාරවත් කිරීමෙන් අනතුරුව සෑම අක්කරයකටම රු. 750 බැගින් වන ආධාර මුදලේ දෙවැනි කොටස ගෙවිය හැක;

(ඇ) අවශ්‍ය පස් සංරක්ෂණ ක්‍රම යෙදීමෙන් අනතුරුව සෑම අක්කරයකටම රු. 750 බැගින් වන ආධාර මුදලේ තුන් වැනි කොටස ගෙවිය හැක;

(ඈ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සෑම අක්කරයකටම රු. 1,000 බැගින් වන ආධාර මුදලේ සතර වැනි කොටස ගෙවිය හැක;

(ඉ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අවුරුද්දකට පසුව සෑම අක්කරයකටම රු. 500 බැගින් වන ආධාර මුදලේ පස්වැනි කොටස ගෙවිය හැක;

(ඊ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අවුරුදු දෙකකට පසුව සෑම අක්කරයකටම රු. 500 බැගින් වන ආධාර මුදලේ හයවැනි කොටස ගෙවිය හැක;

(උ) නැවත වගා කිරීම සම්පූර්ණ කිරීමෙන් අවුරුදු තුනකට පසුව සෑම අක්කරයකටම රු. 750 බැගින් වන ආධාර මුදලේ හත්වැනි කොටස ගෙවිය හැක.

(2) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයෙහි පස සාරවත් කිරීම අවශ්‍ය නොවේයයි තේ පාලක විසින් සලකනු ලබන අවස්ථාවන් හිදී, (1) (ආ) වැනි උප වගන්තියෙහි සඳහන් ආධාරය මුදලේ දෙවැනි කොටය ගෙවිය යුතු නොවේ.

(3) වරින්වර සංශෝධනය කරන ලද්දාවූ, 1958 නොවැම්බර් 7 වැනි දින සහ අංක 11,579 දරන රජයේ ගැසට් පත්‍රයෙහි පළ කර ඇති 1958 තේ ආධාර නියෝගයන්හි විධිවිධානවලටම අනුකූල නොවී, කලින් නිකුත් කර ඇති නැවත වගා අවසර පත්‍ර වෙනුවෙන් 1973 නොවැම්බර් 03 වැනි දින හෝ ඊට පසුව හෝ ගෙවිය යුතුව ඇති ආධාර මුදල් කොටස් මෙම නියෝගයෙහි (1) වැනි උප වගන්තියෙහි සඳහන් ප්‍රමාණයන් අනුව ගෙවිය හැක.

(4) නැවත වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය අක්කරයකට අඩු වන අවස්ථාවන්හිදී හෝ එම බිම් ප්‍රමාණයට අක්කරයකට අඩු කොටසක් ඇතුළත් වන අවස්ථාවන්හිදී හෝ එවැනි අක්කරයකට අඩු වන බිම් කොටස, සම්පූර්ණ අක්කරයකට ඇති අනුපාතය අනුව ගණන් බලා මෙම නියෝගයන්හි (1) වැනි උප වගන්තියෙහි සඳහන් ගෙවීම් කළ යුතුවේ.

5. (1) 4 වැනි නියෝගය යටතේ ආධාර මුදලේ පළමුවැනි කොටස ගෙවනු ලැබූ සෑම පුද්ගලයෙකු විසින්ම 8 වැනි නියෝගය යටතේ තේ පාලක විසින් නිකුත් කරනු ලබන විධානයන්, නියම යන්, සීමාවන් හෝ තහනම් වලට අනුකූලව ක්‍රියා කළ යුතුවා පමණක් නොව නැවත වගා කළ බිම් ප්‍රමාණය යහපත් කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වා ගැනීමද කළ යුතුය.

(2) නැවත වගා අවසර පත්‍රයක් නිකුත් කරන ලද බිම් ප්‍රමාණ යක් වෙනුවෙන් 4 වැනි නියෝගය යටතේ තවත් ආධාර මුදල් කොටස් එකක් හෝ වැඩි ගණනක් ගෙවීමට ඇති තේ වත්තක හෝ කුඩා තේ ඉඩමක හෝ අයිතිකරු විසින් තේ පාලකගෙන් ලබාගත් ලිඛිත අනුමැතියක් නොමැතිව නැවත වගා කිරීමට අවසර ලත් එම මුළු බිම් ප්‍රමාණය හෝ එහි කොටසක් විකිණීම හෝ වෙනත් අයුරින් පැවරීමක් හෝ නොකළ යුතුය.

6. තේ වත්තකට හෝ කුඩා තේ ඉඩමකට මුළුමනින්ම හෝ එහි නියමිත කොටසකට හෝ පෝර යෙදීම සඳහා ගෙවනු ලබන ආධාර ප්‍රමාණයන්, වර්ෂයකට එක් අක්කරයකට රු. 350 ක උපරිමයකට යටත්ව, එවැනි වත්තේ හෝ කුඩා ඉඩමේ අවශ්‍ය තාවයන් අනුව තේ පාලක විසින් තීරණය කරනු ඇත. මෙම ආධාරය කළ යුත්තේ වටිනාකමින් භාගයකට හෝ ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන මිලක් අනුව තේ පාලක විසින් සපයනු ලබන පෝර වලිනි.

7. තේ කර්මාන්තශාලාවක නිෂ්පාදනය කරනු ලබන තේ ඇසිරීම සඳහා පාවිච්චි කරන පෙට්ටි වෙනුවෙන් ගෙවිය හැකි ආධාර මුදල වනුයේ තේ පෙට්ටි ලෑලි එක් කට්ටලයක මිල හා ස්ථාවර වූ රු. 3 ක මුදල අතර ඇති වෙනසය.

8. අංක 4, 6 හෝ 7 වැනි නියෝගය යටතේ කිසියම් පුද්ගල යෙකුට ආධාර මුදලක් ගෙවීමට ඇති හෝ ගෙවනු ලැබූ අවස්ථා වන්හිදී එම පුද්ගලයා විසින් තේ වත්ත හෝ කුඩා තේ ඉඩම හෝ නැවත වගා කිරීම, තේ වත්තට හෝ කුඩා තේ ඉඩමට හෝ පෝර යෙදීම හෝ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කළ තේ ඇසිරීම සතුටුදායක ආකාරයකට කිරීම පිණිස අවශ්‍යයයි හැඟෙන පරිදි තේ පාලක විසින් ලිඛිත නිවේදනයක් මගින් දන්වනු ලබන කාලසීමා වක් තුළදී එහි සඳහන් විධානයන්, නියමයන් සීමාවන් හෝ තහනම් අනුව කටයුතු කළ යුතුය.

9. ආධාර මුදලක් හෝ ඉන් කොටසක් හෝ ගෙවනු ලැබූ යම් පුද්ගලයෙකු අංක 5 හෝ 8 වැනි නියෝගයේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කර හෝ ඒ අනුව කටයුතු කිරීමට අසමත්ව ඇතැයි තේ පාලක අදහස් කරන්නේ නම්, ලිඛිතව කරනු ලබන නිවේදන යක් මගින් එකී පුද්ගලයා වෙත ගෙවා ඇති ආධාර මුදල් ප්‍රමාණය වහාම හෝ එම නිවේදනය මගින් නියම කරනු ලබන කාලසීමාවක් තුළදී හෝ ආපසු ගෙවන ලෙස තේ පාලකට නියම කළ හැක. මෙම නියෝගය යටතේ එවැනි නිවේදනයක් කරනු ලැබූ කිසිම පුද්ගල යෙකු එම නිවේදනය පැහැර හැරීම නොකළ යුතුය.

10. තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් මෙම නියෝගයන් යටතේ තමා වෙත ප්‍රදානය කර ඇති හෝ නියමකර ඇති හෝ පවරා ඇති කිසියම් බලතල, රාජකාරි හෝ කාර්යයන් පාවිච්චි කිරීමට, ඉටු කිරීමට හෝ ක්‍රියාවේ යෙදවීමට තේ පාලන දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට බලය පැවරීමට තේ පාලකට හැකිය.

11. (අ) මෙහි 5, 8 හෝ 9 වැනි නියෝගයන්හි විධි විධාන උල්ලංඝනය කරන්නා වූ හෝ ඒ අනුව ක්‍රියා කිරීමට අසමත් වන්නා වූ, හෝ

(ආ) මෙම නියෝගයන් යටතේ වූ කිසියම් ඉල්ලුම් පත්‍රයක් හෝ ප්‍රකාශයක හෝ කිසියම් තොරතුරක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමන් දන්නා වූ යම් ප්‍රකාශයක් කරන්නාවූ, හෝ

(ඇ) ආධාර මුදලක් ඉල්ලන ඉල්ලුම්කරුවෙකු හෝ ආධාර මුදලක් ලබා ගන්නා අයෙකු වශයෙන් තේ පාලක වෙත අසත්‍ය තොරතුරු සපයන්නා වූ,

සෑම පුද්ගලයෙකුම දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරුවෙකු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගය කින් පසුව වැරදිකරුයයි තීරණය කරනු ලැබුවහොත් රු. 1,000 කට නොවැඩි දඩයකට හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව හය මසකට නොවැඩි සිර දඬුවමකට හෝ එවැනි දඩයක් සහ සිර දඬුවමක් යන දෙකටම යටත් විය යුතු වන්නේ ය.

12. මෙම නියෝගයන්හි, තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් හෝ තේ කර්මාන්තශාලාවක් හෝ සම්බන්ධයෙන් "අයිතිකරු" යනුවෙන් අදහස් වන්නේ 1957 අංක 51 දරණ තේ පාලන පනතේ විධිවිධාන යටතේ එවැනි තේ වත්තක හෝ කුඩා තේ ඉඩමක හෝ තේ කර්මාන්ත ශාලාවක හෝ අයිතිකරු වශයෙන් ලියාපදිංචි ඇති හෝ ලියාපදිංචි කරනු ලැබ ඇතැයි සැලකෙන පුද්ගලයාය.

12–149—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත

5 වැනි වගන්තිය යටතේ නිවේදනය

(110 වැනි අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අති රේකයෙහි පළ කරන ලද්දාවූද, 1959 ඔක්තෝබර් මස 16 වැනි දින අංක 11,902 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද්දාවූද, නිවේදනය, එයට යා කොට ඇති උපලේඛනයෙහි "නැගෙනහිර පළාත—අම්පාර දිස්ත්‍රික්කය" යන ශීර්ෂය යටතේ—

(1) උහන කොට්ඨාශයට අදාළ වන අංක 36 දරණ විෂය වෙනුවට මෙහි "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ; හා

(2) ගොනාගොල්ල කොට්ඨාශයට අදාළ වන අංක 36 අ දරණ විෂය වෙනුවට මෙහි "ආ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ; හා

(3) අංක 36ආ විෂයයට ඉක්බිතිවම මෙහි "ඇ" උපලේඛනයෙහි සඳහන් 36අ දරණ අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් ;

1973 දෙසැම්බර් 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1973 නොවැම්බර් මස 14 දින,
කොළඹ දී.

### "අ" උපලේඛනය

**36. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත උහන කොට්ඨාශය :—**

හිමිදුරාව
කහටගස්යාය
කොටේලිද
කෝමාරිය
මහකන්ඩිය
ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ ග්‍රාම අංක 20 සිට 24 දක්වා
උහන

### "ආ" උපලේඛනය

**36අ. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත ගොනාගොල්ල කොට්ඨාශය :—**

බක්කිඇල්ල
බන්ඩාරදූව
බොක්කේබැද්ද
දිවුලාන
ගොනාගොල්ල
කොමොඩාන
පහුර
පොරෝදුවුවල
ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ ග්‍රාම අංක 27 සිට 34 සහ 36
වැල්ලවාය

### "ඇ" උපලේඛනය

**36ආ පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත පරගහකැලේ-නාමල්ඔය කොට්ඨාශය :—**

කෘෂිකර්ම හමුදා කඳවුර
හිමිදුරාව දකුණ
නාමල්ඔය
පන්සල් හන්දිය
පොල්වත්ත අංක 110 කොටස
ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ ග්‍රාම අංක 1 (වෑමින්න)
2. (පරගහකැලේ) සහ 1 බී සිට 10 බී
උස්බිම් පෙදෙස

12–107—72.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(7) හා 4 (3) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, මාතර දිස්ත්‍රික්කය තුල පිහිටි දික්වැල්ල ගම කාර්ය සභාවේ කොට්ඨාශ අංක 1 සිට 9 දක්වා සහ 14 සිට 18 දක්වා ඇතුලත් ප්‍රදේශය සඳහා 1972 අගෝස්තු මස 4 වැනි දින අංක 19 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥව මගින් සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සාමාජික හා සභාපති වන දික්වැල්ල, දොරේමුරේ පදිංචි ජී. එච්. එම්. චාර්ල්ස් සිරිනාථ් මහතා එකී තනතුරුවලින් මෙයින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12–195—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

ආඥා අංකය: 38

### වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇත්තා වූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : පීජ් 13/70 (39), සීඊබී/එල්ඒ/8.
වර්ෂ 1973 නොවැම්බර් 16 දින,
කොළඹ දීය.

#### උපලේඛනය

ශ්‍රී ලංකා ද්වීපයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ ඇතුල් කෝට්ටේ ග්‍රාම සේවක වසමේ (521) වික්‍රමසිංහ මාවතේ අංක 980/4 දරණ ඉඩමෙන් ප්‍රමාණයේ අක්කර 0 රූඩ් 0 පර්චස් 16 පමණවූ ඉඩම් කොටස් 1 මායිම :—

උතුරට : ව.ප. අංක 980/3 දරණ ඉඩම ;

නැගෙනහිරට : වික්‍රමසිංහ මාවත ;

දකුණට : ඇතුල්කෝට්ටේ-බත්තරමුල්ල ප්‍රසිද්ධ පාර ;

බටහිරට : බත්තරමුල්ල පාරේ ව.ප. අංක 25 දරණ ඉඩම.

හිමිකම් කියන අය : එච්. ඇග්නස් අමරසිංහ මහත්මිය, අංක 64, පන්සල පාර, කොළඹ 10.

12–226—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 46 (3) වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමා, මෙයට යාවෙන උපලේඛනයෙහි සඳහන් නිලධාරීන් එකී පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නිලධාරීන් වශයෙන් වර්ෂ 1973. 12. 01 වැනි දින සිට බලපැවැත් වෙන සේ පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා.

1973. 11. 24 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

රැකිරක්ෂා සහකාර නිලධාරීන්
වෘත්තිය විශ්ලේෂක නිලධාරීන්

12–144/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනත

(2 වැනි අධිකාරය වන) අර්ථනිරූපන ආඥාපනතේ 12 වැනි වගන්තිය සමග කියැවෙන (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 52 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමා, මෙයට යාවෙන උපලේඛනයෙහි සඳහන් නිලධාරීන් (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නිලධාරීන් වශයෙන් වර්ෂ 1973. 12. 01 වැනි දින සිට බලපැවැත්වෙන සේ පත් කළ බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා.

1973. 11. 24 වැනි දින.
කොළඹ දී ය.

#### උපලේඛනය

රැකිරක්ෂා සහකාර නිලධාරීන්
වෘත්තිය විශ්ලේෂක නිලධාරීන්

12–144/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම ඒ වගන්තිය යටතේ කරනු ලැබ 1973 අගෝස්තු මස 10 වැනි දින අංක 72 දරණ ගැසට් පත්‍රයේ පළ කෙරුන ආඥාවේ (අ) ඡේදය යටතේ සඳහන් වූ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පිහිටි නැගෙනහිර කඩවත් කෝරලේ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදයකයින්ගේ සභාවේ (අ) 1 සහ (ආ) ඡේදය යටතේ වූ උඩයාරේගේ හේරත් හාමි මහතා යන වචන වෙනුවට උඩයාරේ වෙල්විදනේගේ හේරත් හාමි මහතා යන වචන ද (අ) ඡේදය යටතේ පලවූ අංක 30 හි මුදලි හාමිගේ උක්කු බණ්ඩා යන වචන වෙනුවට හේරත් හාමිගේ උක්කු බණ්ඩා යන වචන ද ආදේශ කර මෙයින් සංශෝධනය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12–194—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සමග කිය විය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, මාතර දිස්ත්‍රික්කය තුල පිහිටි දෙයියන්දර ගම් ප්‍රදේශය සඳහා 1973 මැයි 4 වැනි දින අංක 58 දරණ ගැසට් නිවේදනය මගින් සංස්ථාපනය කරනු ලැබූ සමගිදයක සභාවේ සාමාජික පල්ලාවෙල, මහඅරඹ පදිංචි වී. ජී. ඩී. කරෝලිස් මහතා එකී තනතුරෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12–255—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

ඇල්.ඩී.—බී. 2/71

**1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත**

16 (2) (ආ) (1) වන වගන්තිය යටතේ නිවේදනය

1971 අංක 28 දරණ පනතින් සංශෝධිත 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 16 (2) (ආ) (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, එකී 16 වන වගන්තිය යටතේ හැඳුනුම් පත්‍ක අනුපිටපතක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් පහක් විය යුතු යැයි මේ නිවේදනයෙන් නියම කරමි.

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1973 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

12-282—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1973 මැයි 25 වැනි දින අංක 61 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 5 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි වැකේ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදයකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කිරිඳිවැල, මැද්දේගම පදිංචි හෙට්ටිආරච්චිවැල්ලඹුර දෙන් ස්ටීවන් ජයසුන්දර මහතා

(2) කිරිඳිවැල, පිංගමුව, නාරංගස්පිටිය පදිංචි අලගියවන්න මොහොට්ටි අප්පුහාමිලාගේ ධර්මදාස අලගියවන්න මහතා

(3) කිරිඳිවැල, කැන්දගොල්ල, කුට්ටිවිල පදිංචි රන්හොටි පේඩිගේ අබේසේන මහතා

(4) පැපිලියවල, දන්ගල්ල පදිංචි දෙබෑගම කංකානම්ලාගේ ඒමිස්සිංඤෝ මහතා

(5) කිරිඳිවැල, මිල්ලතේ පදිංචි එදිරිසිංහ ආරච්චිගේ අගෝරිස් එදිරිසිංහ මහතා

(6) කිරිඳිවැල, මැද්දේගම පදිංචි රණතුංග ආරච්චිගේ දනියෙල් පෙරේරා රනතුංග මහතා

(7) පැපිලියවල, අනුරාගොඩ පදිංචි විලියම් පෙරේරා අත්තනගොඩ මහතා

(8) මණ්ඩාවල, අනුරාගොඩ පදිංචි අත්තනගොඩ කංකානම්ලාගේ නෝමිස් අත්තනගොඩ මහතා

(9) කිරිඳිවැල, දියවාල පදිංචි දෙන් කුලසේන වික්‍රමසිංහ මහතා

(10) කිරිඳිවැල, දියවාල පදිංචි හිරලූ පතිරැන්නැහැලාගේ නිතිවර්ධන පෙරේරා මහතා

(11) පැපිලියවල, ගනිහිගම පදිංචි වලිමුනි දේවගේ සයිමන් ප්‍රේමරත්න මහතා

(12) පැපිලියවල, වෙරළුගම්පොල පදිංචි පින්නවල අප්පුහාමිලාගේ සාපින් අප්පුහාමි මහතා

(13) පැපිලියවල, වෙරළුගම්පොල පදිංචි පින්නවල අප්පුහාමිලාගේ දෙන් ඒබ්‍රහම් අප්පුහාමි මහතා

(14) කිරිඳිවැල, මයිලවලාන පදිංචි මාන්කෝට්ටෙ කංකානම්ලාගේ පීටර් රූපසිංහ මහතා

(15) පැපිලියවල, 'සිරිපැල' හි පදිංචි ගනේපොල ආරච්චිගේ රිචඩ් පෙරේරා විජේසේකර මහතා

(16) පැපිලියවල, දංගල්ල පදිංචි පතිරැන්නැහැලාගේ ඩේවිඩ් සිංඤෝ පතිරැන්නැහැ මහතා

(17) පැපිලියවල, වෙරහැර පදිංචි කලංචි දේවගේ අගිලිස් කරුණාරත්න මහතා

(18) පැපිලියවල, වෙරහැර පදිංචි වනිගරත්න මුදියන්සේලාගේ මැන්ඩිස් මහතා

(19) කිරිඳිවැල, හිස්සැල්ල පදිංචි කීරගල දේවගේ පේටින් මහතා

(20) කිරිඳිවැල, මාහල්ඔලුව පදිංචි රන්කිරි පතිරැන්නැහැලාගේ කරුණාසිල මහතා

(21) කිරිඳවැල, උඩගම පදිංචි වරුසමාන පේඩිගේ ජෝන් මහතා

(22) වතුරුගම, කන්නිමහර පදිංචි මුතුගල ආරච්චිගේ දෙන් හේමපාල මහතා

(23) වතුරුගම, ඉදුරුගල්ල පදිංචි ජයකොඩි ආරච්චිගේ නවරත්න මහතා

(24) වතුරුගම පදිංචි දෙන් ජේම්ස් පල්ලෙවෙල මහතා

(25) පැපිලියවල, පල්ලේගම පදිංචි ඉලංගකෝන් දසනායකගේ නෝමිස් දසනායක මහතා

(26) පැපිලියවල, වල්පොල පදිංචි උඩකන්දගේ ආරියදස මහතා

(27) රදවාන, රදවාන උතුර පදිංචි වැලේරා කීර්තිරත්න මුදියන්සේලාගේ කිතෝනිස් කීර්තිරත්න මහතා

(28) රදවාන, රදවාන දකුණ පදිංචි සම්මද්දප්පෙරුම මොහොට්ටි අප්පුහාමිලාගේ බර්ටි සම්මද්දප්පෙරුම මහතා

(29) කිරිඳිවැල, බෝගහවත්ත පදිංචි වුතු මුදලිගේ පේමතිලක පයවර්ධන මහතා

(30) කිරිඳිවැල, ඇල්ඔවිට පදිංචි දෙන් තේරිස් වික්‍රමසිංහ මහතා

(ආ) කිරිඳිවැල, මැද්දේගම පදිංචි හෙට්ටිආරච්චිවැල්ලඹුර දෙන් ස්ටීවන් ජයසුන්දර මහතා ඉහත කී සභාවේ සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12-281—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

49 ඡෙදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජයමගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

ගා/අත්ගා/168.
1973 නොවැම්බර් 28 දින,
කොළඹ දීය.

උපලේඛනය

දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තුල කඩේ වීදිය දකුණ ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි මෙරෙංචිගෙවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති රූඩ් 3 පර්. 3 සමණවූ ඉඩම් කොටස :—

උතුරට : දෙල්ගහකොරටුව ;

දකුණට : වීරක්කඩින ගුපිටිය වත්ත

නැගෙනහිරට : තන්දක්කාර වලව්වෙවත්ත ;

බස්නාහිරට : දෙල්ගහකොරටුව.

12-250—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

**නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය)**

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කොළඹ පදිංචි සකුන්තලා මෝහිනී අබේකෝන් මෙනෙවියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–240—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය)**

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලයලත් ගල්කිස්සේ වටරප්පල පාරේ අංක 89/1 පදිංචි සම්පතවඩුගේ මායා මංගළිකා කුසුම්රාණි ද සිල්වා මෙනෙවියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–241—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහළ භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් මොරටුවේ පදිංචි රාජපක්ෂ අව්විල්ලෑ පියදස මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–242—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කොළඹ 7 ග්‍රෙගරි පාරේ අංක 25 පදිංචි ග්ල්ඩිස් රන්ජිතමාලර් විසුවාලිංගම් මහත්මියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–244—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය)**

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලයලත් 165, මුතුවැල්ල මාවත, කොළඹ 15 යන ස්ථානයේ පදිංචි කංකානම් පතිරණගේ ගාමිණී අබේවික්‍රම මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–245—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට බලයලත් කැළණියේ, දළුගම පදිංචි කුමාරගේ සලමොන් නන්දපාල පෙරේරා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–247 —73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට බලය ලත් කැඳල බූස්සේ, පදිංචි තුප්පහි බාර්බර්ට් ද සිල්වා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12–249—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඩබ්ලිව්. 105/1162.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත, 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව මහනුවර, කන්දේ වීදියේ අංක 13, ලංකා වතු සේවා සංගමය සහ කොළඹ 1, රැජින වීදියේ අංක 45 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් බාරේ, තුම්මෝදර, හල්පේ වතුයායේ අයිතිකරුවන් වන ද සිලෝන් රබර් කොම්පැණි ලිමිටඩ්, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කම්කරු විනිශ්චය සභා අංක VI (රත්නපුර) වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 නොවැම්බර් මස 22 දින,
කොළඹ දීය.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරවුල් පනත

මහනුවර, කන්දේ වීදියේ අංක 13, ලංකා වතු සේවා සංගමය

සහ

කොළඹ 1, රැජින වීදියේ, අංක 45 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ කොම්පැණි ලිමිටඩ් බාරේ තුම්මෝදර හල්පේ වතුයායේ අයිතිකරුවන් වන ද සිලෝන් රබර් කොම්පැණි ලිමිටඩ්

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

#### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කරුණ නම්, තුම්මෝදර, හල්පේ වතුයායේ පාලක පක්ෂය විසින් (ඉහත සඳහන් සමිතියේ සාමාජික) ක්ෂෙත්‍ර නිලධාරි—ඇස්. ඇම්. ඩී. තිමෝති මහතා, හල්පේ වතුයායේ වග කොටසේ සිට හල්පේ කොටසට මාරුකිරීම යුක්තිසහගතද යන්න හා ඔහුට කුමන සහනයක් හිමිද යන්නක් වේ.

1973 නොවැම්බර් මස 20 වැනිද වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදනා ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12–70—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය

### 1972.12.31 දින තත්ත්ව ප්‍රකාශණය

| | මෙම වර්ෂය | | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|---|
| | මුල් ගත් මිළ රු. | මෙදිනට ක්ෂය කිරීම් රු. | පොතේ අගය රු. | මුල් ගත් මිළ රු. | පොතේ අගය රු. |
| **ස්ථාවර වත්කම්** | | | | | |
| ගොඩනැගිලි ... ... ... ... | 6,16,334 ... | 77,838 ... | 5,38,496 ... | 6,16,334 ... | 5,52,304 |
| උපකරණ ... ... ... ... | 1,59,693 ... | 65,729 ... | 93,964 ... | 1,53,287 ... | 97,394 |
| පුස්තකාලය ... ... ... ... | 35,928 ... | 18,994 ... | 16,934 ... | 32,689 ... | 17,119 |
| එකතුව ... | 8,11,955 | 1,62,561 | 6,49,394 | 8,02,310 | 6,66,817 |
| **ආයෝජන** | | | | | |
| ස්ථාවර තැන්පතු ... ... ... ... ... | | 1,13,500 | | 1,05,610 | |
| ඉතිරිකිරීමේ තැන්පතු ... ... ... ... | | 73,164 | | 68,282 | |
| | | | 1,86,664 | | 1,73,892 |
| **ජංගම වත්කම්** | | | | | |
| බැංකු සහ මුදල් ශේෂයන් ... ... ... ... | | 1,39,523 | | 71,733 | |
| තැපැල් මාර්ගික පාඨමාලා තොග ... ... ... ... | | 37,981 | | 46,713 | |
| ලැබීමට ඇති රජයේ ආධාර ... ... ... ... | | 15,000 | | 15,000 | |
| ලැබීමට ඇති තැපැල් මාර්ගික පාඨමාලා ගාස්තු ... ... ... | | 14,030 | | 9,870 | |
| සේවක අත්තිකාරම් ... ... ... ... | | 3,231 | | 1,165 | |
| කලින් ගෙවීම් සහ තැන්පතු ... ... ... ... | | 3,167 | | 2,291 | |
| ප්‍රවර්තන ලැබීම් ... ... ... ... ... | | 2,350 | | — | |
| ප්‍රකාශණ තොග ... ... ... ... ... | | 2,324 | | — | |
| | | | 2,17,606 | | 1,46,772 |
| මුළු වත්කම් ... | | | 10,53,664 | | 9,87,481 |
| **අඩුකළා—බැරකම් සහ වෙන්කිරීම්** | | | | | |
| රජයේ ණය ... ... ... ... ... | | 3,00,000 | | 3,00,000 | |
| කලින් ගෙවූ පැතැල් මාර්ගික පාඨමාලා ගාස්තු ... ... ... | | 53,072 | | 18,528 | |
| ප්‍රවර්තන ගෙවීම් ... ... ... ... ... | | 35,709 | | 30,548 | |
| කලින් ගෙවූ සාමාජික ගාස්තු ... ... ... ... | | 23,230 | | 27,160 | |
| තැපැල් මාර්ගික පාඨමාලා බැදීම ... ... ... ... | | 7,920 | | 18,988 | |
| කලින් ගෙවූ විභාග ගාස්තු ... ... ... ... | | 5,550 | | 3,125 | |
| | | | 4,25,481 | | 3,98,349 |
| ශුද්ධ වත්කම් ... | | | 6,28,183 | | 5,89,132 |

### ඡහත සඳහන් අරමුදල් නියෝජනය වේ

| | | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|---|
| **ආයතන අරමුදල** | | රු. | රු. | රු. | රු. |
| 1972.12.31 දිනට ශේෂ පත්‍රය අනුව | ... | 5,30,685 | | 4,54,757 | |
| එකතු : 1972 සඳහා අතිරික්තය | ... | 39,051 | | 75,928 | |
| | | | 5,69,736 | | 5,30,685 |
| **ප්‍රකාශණ අරමුදල** | | | | | |
| 1970 ඇතිකළ අරමුදල ... | ... | 65,000 | | 65,000 | |
| අඩුකළා—සිංහල පොත් සඳහා වූ වියදම | ... | 6,553 | | 6,553 | |
| | | | 58,447 | | 58,447 |
| | එකතුව ... | | 6,28,183 | | 5,89,132 |

| **පරිත්‍යාග අරමුදල්** | | රු. |
|---|---|---|
| ලැන්ඩර් ත්‍යාග | ... | 26,434 |
| බෙග්බි අනුස්මරණ | ... | 11,411 |
| | එකතුව ... | 37,845 |

කේ. සච්චිතානන්ද,
සභාපති.

### ගණන් පරීක්ෂකගේ වාර්තාව

ඉහත ඇති තත්ත්ව ප්‍රකාශණය හා අමුණා ඇති ආදයම් ප්‍රකාශණය, මා විසින් පරීක්ෂා කළ බවත්, මගේ අදහස අනුව ඒවා පිළිවෙළින් 1972 දෙසැම්බර් 31 වන දිනට ආයතනයේ කටයුතු පිළිබඳවත්, එම දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් හා වියදම් පිළිබඳවත්, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරයි.

සිසිල් අර්සකුලරත්න,
වරලත් ගණකාධිකාරී.

1973 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

### 1972 සඳහා ආදයම් ප්‍රකාශය

| | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **පරීක්ෂණවලින් ලද සහභාගය** | | | | |
| ගාස්තු ... ... ... | 1,50,950 | | 1,41,625 | |
| අඩුකළා—සෘජු පිරිවැය ... ... | 47,707 | 1,03,243 | 41,718 | 99,907 |
| **සාමාජිකත්වයෙන් ලද සහභාගය** | | | | |
| ගාස්තු ... ... ... | 1,00,435 | | 94,490 | |
| අඩුකළා—සෘජු පිරිවැය ... ... | 28,552 | 71,883 | 13,093 | 81,397 |
| **පුහුණුකිරීම් කටයුතුවලින් ලද සහභාගය** | | | | |
| ගාස්තු ... ... ... | 1,02,771 | | 90,399 | |
| අඩුකළා—සෘජු පිරිවැය ... ... | 70,184 | 32,587 | 46,941 | 43,458 |
| **විවිධ ආදයම්** | | | | |
| තැන්පතු සඳහා පොලී ... ... | | 12,772 | | 12,716 |
| **මුළු සහභාගයන්** ... | | 2,20,485 | | 2,37,478 |
| අඩුකළා—පොදු පිරිවැය | | | | |
| පොදු කාරක මණ්ඩලය ... ... | 1,08,273 | | 92,045 | |
| භූමිය ... ... ... | 24,622 | | 27,420 | |
| ලිපි කටයුතු ... ... | 29,142 | | 24,768 | |
| උපකරණ ... ... | 13,146 | | 10,734 | |
| පුස්තකාල පොත් ... ... | 3,423 | | 4,165 | |
| අනිකුත් වියදම් ... ... | 2,828 | 1,81,434 | 2,418 | 1,61,550 |
| **අතිරික්තය** ... | | 39,051 | | 75,928 |

### 1972 පරීක්ෂණවලින් ලද සහභාගය

| ගාස්තු | @ | මෙම වර්ෂය පුද්ගල යින් | මෙම වර්ෂය පත්‍ර | මෙම වර්ෂය රුපියල් | පසුගිය වර්ෂය පුද්ගල යින් | පසුගිය වර්ෂය පත්‍ර | පසුගිය වර්ෂය රුපියල් |
|---|---|---|---|---|---|---|---|
| අවසාන පරීක්ෂණය—සම්පූර්ණ ... ... | 300 | 18 | 144 | 5,400 | 38 | 304 | 11,400 |
| අවසාන පරීක්ෂණය—කොටසක් ... ... | 200 | 380 | 1,532 | 76,000 | 344 | 1,399 | 68,800 |
| අවසාන පරීක්ෂණය—ඉතිරි පත්‍ර ... ... | 150 | 12 | 48 | 1,800 | 11 | 44 | 1,650 |
| අවසාන පරීක්ෂණය—එක් පත්‍රයක් පමණක් ... | 50 | 6 | 6 | 300 | 9 | 9 | 450 |
| අවසාන පරීක්ෂණය—එකතුව ... ... | | 416 | 1,730 | 83,500 | 402 | 1,756 | 82,300 |
| මධ්‍ය පරීක්ෂණය ... ... ... | 200 | 300 | 1,200 | 60,000 | 251 | 1,004 | 50,200 |
| පරීක්ෂණයට පෙනී සිටි මුළු ගණන ... | | 716 | 2,930 | 1,43,500 | 653 | 2,760 | 1,32,500 |
| අභිමිකළ ගාස්තු ... ... ... | — | 89 | — | 7,550 | 84 | — | 9,125 |
| අඩුකළා—ආයතන ශිෂ්‍යත්වධාරී ආධාර දීමනාව ... | — | 1 | — | 100 | — | — | — |
| ආදයමේ එකතුව ... | | | | 1,50,950 | | | 1,41,625 |
| අඩුකළා—සෘජු පිරිවැය | | | | | | | |
| උත්තර පත්‍ර 2,898ක් පරීක්ෂා කිරීමට රු. 7.50 බැගින් ... | | | 21,735 | | | 20,220 | |
| පත්‍ර සැකසීම සහ ප්‍රමිත කිරීම ... ... | | | 15,550 | | | 15,600 | |
| විභාග පරීක්ෂකවරුන් දින 26 කට ... ... | | | 650 | | | 510 | |
| මුළු ගාස්තු ... | | | 37,935 | | | 36,330 | |
| මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍ය ... ... | | | 10,857 | | | 6,958 | |
| පුවත්පත් දැන්වීම් ... ... ... | | | 711 | | | 846 | |
| අඩුකළා—පසුගිය ප්‍රශ්න පත්‍ර විකිණීමෙන් ... | | | 1,796 | 47,707 | | 2,416 | 41,718 |
| ආදයම් ප්‍රකාශයට ගෙන ගිය සහභාගය ... | | | | 1,03,243 | | | 99,907 |

### සටහන 1—අපේක්ෂකයෝ

| | ප්‍රතිඥර්ථ කාලය ඇතුලත | ප්‍රතිඥර්ථ කාලයෙන් පසු | එකතුව |
|---|---|---|---|
| අවසාන ... ... ... ... | 114 | 302 | 416 |
| මධ්‍යම ... ... ... ... | 261 | 39 | 300 |
| අයදුම්කරුවන් ... ... ... | 375 | 341 | 716 |
| අභිමිකළවුන් ... ... ... | 30 | 59 | 89 |
| එකතුව ... | 405 | 400 | 805 |

**සටහන 2—පත්‍ර**

ප්‍රශ්න පත්‍ර එකකට හෝ එකකට වැඩි ගණනකට පෙනී සිටි අපේක්ෂකයන්ගෙන් නොපැමිණි සංඛ්‍යාව 32 කි. (1971 දී එය 64 කි.)

**සටහන 3—අහිමි කිරීම ක්‍රමයේ වෙනස්වීම**

1972 වනතුරු සම්පූර්ණයෙන්ම නොපැමිණිමේදී වෛද්‍ය සහතිකයකින් තහවුරු කළ විට, 50% ක් අහිමිකළ අතර, (50% ඊළඟ පරීක්ෂණයට ඉදිරියට ගෙන යන ලදී) එසේ නොමැති වූ විට 100% අහිමි කරන ලදී. 1972 දෙසැම්බර් මස සිට සම්පූර්ණයෙන්ම නොපැමිණි විට රු. 50.00 ක් පමණක් අහිමිකරන ලද අතර, ඊළඟ පරීක්ෂණයට පෙනී නො සිටින්නේ නම් ඉතිරි ප්‍රමාණයද අහිමි කරන ලදී.

**1972 සාමාජිකත්වයෙන් ලද සහභාගය**

| | @ | මෙම වර්ෂය සාමාජිකයින් | මෙම වර්ෂය රුපියල් | පසුගිය වර්ෂය සාමාජිකයින් | පසුගිය වර්ෂය රුපියල් |
|---|---|---|---|---|---|
| සාමාජික ගාස්තු | | | | | |
| සාමාන්‍ය සාමාජිකයින් | 125 | 377 | 47,125 | 313 | 39,125 |
| විශේෂ හා සම්මාන | 5 | 3 | 15 | 3 | 15 |
| මුළු අළුත්කිරීම | | 380 | 47,140 | 316 | 39,140 |
| බඳවා ගැනීම | 250 | 45 | 11,250 | 74 | 18,500 |
| මුළු සාමාජික ගාස්තු (සටහන 1) | | 425 | 58,390 | 390 | 57,640 |
| වෘත්තීය සහතික සඳහා ගාස්තු | 325 | 112 | 36,400 | 108 | 35,100 |
| අධි සාමාජික ලියාපදිංචි ගාස්තු | 250 | 22 | 5,500 | 7 | 1,750 |
| ගාස්තු අළුත් කිරීමෙන් ලත් විවිධිස | | 2 | 135 | | |
| දඩ මුදල් | | 1 | 10 | | |
| එකතුව | | | 1,00,435 | | 94,490 |
| අඩුකළා—සෘජු පිරිවැය | | | | | |
| ආයතනයේ සහරාව (සටහන 2) | | 8,009 | | 3,975 | |
| රැස්වීම් සඳහා ආහාරපාන | | 5,287 | | 1,830 | |
| ප්‍රසිද්ධ දේශනා | | 4,324 | | 1,481 | |
| පිනවීම් සහ සංග්‍රහ | | 3,013 | | 481 | |
| වාර්ෂික වාර්තාව | | 2,750 | | 2,570 | |
| ප්‍රකාශණ සහරා | | 1,744 | | 1,221 | |
| ශිෂ්‍ය සංගමය සඳහා ආධාර | | 1,500 | | 750 | |
| ලිපි ද්‍රව්‍ය | | 330 | | 756 | |
| නෛතික ගාස්තු | | 105 | | 367 | |
| සාමාජිකයන්ගේ සම්මන්ත්‍රන (සටහන 3) | | 1,490 | 28,552 | 338 | 13,093 |
| ආදයම් ප්‍රකාශයට ගෙන ගිය සහභාගය | | | 71,883 | | 81,397 |

**සාමාජිකත්වයෙන් ලද සහභාගය පිළිබඳ සටහන්**

සටහන 1—සාමාජිකත්වය

| | සාමාජික | අධි සාමාජික | එකතුව |
|---|---|---|---|
| 1971 දයකයින් | 307 | 83 | 390 |
| අඩුකළා—1971 මියගිය | 1 | 4 | 5 |
| 1971.12.31 දිනට සාමාජිකත්වය | 306 | 79 | 385 |
| අඩුකළා—සාමාජිකත්වය අවසන් වූ | 5 | — | 5 |
| 1972 අළුත්කිරීම් | 301 | 79 | 380 |
| බඳවාගැනීම් | 45 | 0 | 45 |
| අධි සාමාජික | 22 | 22 | — |
| 1972 දයකයින් | 324 | 101 | 425 |
| අඩුකළා—1972 මියගිය | — | 3 | 3 |
| 1972.12.31 දිනට සාමාජිකත්වය | 324 | 98 | 422 |

සටහන 2 :

| ආයතන සහරාව | මෙම වර්ෂය I. කලාපය | මෙම වර්ෂය II. කලාපය | මෙම වර්ෂය එකතුව | පසුගිය වර්ෂය |
|---|---|---|---|---|
| පිරිවැය | 4,566 | 6,464 | 11,030 | 7,533 |
| අඩුව : දැන්වීම් | 1,250 | 600 | 1,850 | 3,200 |
| ශුද්ධ පිරිවැය | 3,316 | 5,864 | 9,180 | 4,333 |
| අඩුව : වර්ෂය තුල විකිණීම් | | | 471 | 858 |
| ශුද්ධ වියදම් | | | 8,709 | 3,475 |
| අඩුව : පූර්ව දැන්වීම් | | | 700 | 500 |
| ශුද්ධ වියදම් | | | 8,009 | 3,975 |

**සටහන 3 :**

සාමාජිකයන්ගේ සම්මන්ත්‍රණ

| | මෙම වර්ෂය (සම්මන්ත්‍රණ 5) | | පසුගිය වර්ෂය (සම්මන්ත්‍රණ 3) | |
|---|---|---|---|---|
| | නො. | රුපියල් | නො. | රුපියල් |
| පැමිණීමේ ගාස්තු ... | 271 | 4,258 | 135 | 3,375 |
| අඩුව : සෘජු පිරිවැය ... | | 4,143 | | 2,643 |
| ආසන්න අතිරික්තය ... | | 115 | | 732 |
| අඩුව : පටිගත කිරීම් හා යතුරුලිවීම් ... | | 1,605 | | 394 |
| ශුද්ධ වියදම ... | | 1,490 | | 338 |

**1972 පුහුණුකිරීම් කටයුතු වලින් ලද සහභාගය**

| | @ | මෙම වර්ෂය ශිෂ්‍යයින් | මෙම වර්ෂය රුපියල් | පසුගිය වර්ෂය ශිෂ්‍යයින් | පසුගිය වර්ෂය රුපියල් |
|---|---|---|---|---|---|
| ගාස්තු | | | | | |
| අවසාන පූර්ණ ... | 400 | 5 | 2,000 | 16 | 6,400 |
| ,, පළමුවන කොටස ... | 225 | 64 | 14,400 | 103 | 23,175 |
| ,, දෙවන කොටස ... | 175 | 96 | 16,800 | 91 | 15,925 |
| එකතුව—අවසාන ... | | 165 | 33,200 | 210 | 45,500 |
| මධ්‍ය ... | 100 | 122 | 12,200 | 92 | 27,600 |
| පාඨමාලා සඳහා එකතුව ... | | 287 | 45,400 | 302 | 73,100 |
| වෙන් වෙන් විෂයයන් ... | | 198 | 10,035 | 169 | 4,867 |
| දේශන සඳහා එකතුව ... | | 485 | 55,435 | 471 | 77,967 |
| තැපැල් මාර්ගික පාඨමාලා (සටහන 1) ... | | 256 | 40,136 | 52 | 6,432 |
| 'ආර්ටිකල්' ලියාපදිංචි කිරීමේ ගාස්තු ... | 50 | 144 | 7,200 | 120 | 6,000 |
| එකතුව ... | | | 1,02,771 | | 90,399 |
| අඩුකළා : සෘජු පිරිවැය | | | | | |
| අධ්‍යයන අධ්‍යක්ෂක සහ කාර්ය මණ්ඩලය ... | | 45,672 | | 41,674 | |
| අඩුකළා—රජයේ ආධාර ... | | 15,000 | | 15,000 | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ශුද්ධ පිරිවැය ... | | 30,672 | | 26,674 | |
| තැපැල් මාර්ගික පාඨමාලා (සටහන 2) ... | | 14,946 | | 3,480 | |
| දේශක ගාස්තු (සටහන 3) ... | | 12,700 | | 10,825 | |
| පුවත්පත් දැන්වීම් ... | | 9,369 | | 4,512 | |
| බඳවාගැනීමේ පාඨමාලාව සහ පරීක්ෂණය (සටහන 4) ... | | 2,240 | | 1,821 | |
| ලිපි ද්‍රව්‍ය ... | | 450 | | 552 | |
| අඩුකළා—සටහන් පත් විකුණුම ... | | 193 | 70,184 | 923 | 46,941 |
| ආදයම් ප්‍රකාශයට ගෙන ගිය සහභාගය ... | | | 32,587 | | 43,458 |

**පුහුණුකිරීම් කටයුතු වලින් ලද සහභාගය පිළිබඳ සටහන්**

**සටහන 1:**

තැපැල් මාර්ගික පාඨමාලා ආදයම

| | මෙම වර්ෂය පුද්ගලයින් | මෙම වර්ෂය පාඩම් | මෙම වර්ෂය රුපියල් | පසුගිය වර්ෂය පුද්ගලයින් | පසුගිය වර්ෂය පාඩම් | පසුගිය වර්ෂය රුපියල් |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිඥූර්ථ ලිපිකරුවන් ... | 193 | 2,071 | 33,136 | 52 | 402 | 6,432 |
| අනිකුත් අය ... | 63 | 658 | 7,000 | ... | ... | — |
| එකතුව ... | 256 | 2,729 | 40,136 | 52 | 402 | 6,432 |

**සටහන 2 :**

තැපැල් මාර්ගික පාඨමාලා වියදම්

| | මෙම වර්ෂය පාඩම් | මෙම වර්ෂය රුපියල් | පසුගිය වර්ෂය පාඩම් | පසුගිය වර්ෂය රුපියල් |
|---|---|---|---|---|
| සෘජු පිරිවැය තක්සේරුව ... | 2,729 | 8,733 | 402 | 1,286 |
| ප්‍රතිඥූර්ථ ලිපිකරුවන් සඳහා නිවැරදි කිරීම ... | 2,071 | 6,213 | 402 | 1,206 |
| විවිධ වියදම් ... | | | | 988 |
| එකතුව ... | 2,729 | 14,946 | 402 | 3,480 |

**සටහන 3 :**

දේශක ගාස්තු

| | මෙම වර්ෂය දේශන | මෙම වර්ෂය රුපියල් | පසුගිය වර්ෂය දේශන | පසුගිය වර්ෂය රුපියල් |
|---|---|---|---|---|
| අවසාන ... | 376 | 9,400 | 280 | 7,000 |
| මධ්‍ය ... | 132 | 3,300 | 153 | 3,825 |
| එකතුව ... | 508 | 12,700 | 433 | 10,825 |

සටහන 4 :
බඳවාගැනීමේ පාඨමාලාව

| | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|
| | දේශන | රුපියල් | දේශන | රුපියල් |
| දේශක ගාස්තු | 61 | 1,525 | 56 | 1,400 |
| පරීක්ෂණය සහ විවිධ වියදම් | | 715 | | 421 |
| එකතුව | | 2,240 | | 1,821 |

සටහන 5 :
නිවැරදි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද තැපැල් මාර්ගික පාඨමාලා සඳහා කලින් ලද ගාස්තු

| | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | රුපියල් | ප්‍රමාණය | රුපියල් |
| ඉදිරිපත් කිරීම සඳහා ඇති පාඩම් මාලා | පාඩම්3,317 | 53,072 | 1,158 | 18,528 |
| අඩුකළා : ලැබීමට ඇති වාර මුදල් | ශිෂ්‍යයන් 61 | 14,030 | 43 | 9,870 |
| කලින් ලද ශුද්ධ ලැබීම | | 39,042 | | 8,658 |

1972 පොදු පිරිවැය

| | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|
| **කාර්ය මණ්ඩලය :** | | | | |
| සෙ.අ.මු. ඇතුළුව වැටුප් | 1,51,295 | | 1,33,500 | |
| අඩුකළා—අධ්‍යයන කාර්ය මණ්ඩලය | 45,672 | | 41,674 | |
| පොදු කාර්ය මණ්ඩල පිරිවැය | 1,05,623 | | 91,826 | |
| දන්වීම් සහ විවිධ | 2,650 | | 219 | |
| | | 1,08,273 | | 92,045 |
| **ලිපි කටයුතු :** | | | | |
| ලිපි ද්‍රව්‍ය | 17,160 | | 14,446 | |
| දුරකථන සහ තැපැල් ගාස්තු | 11,982 | | 10,322 | |
| | | 29,142 | | 24,768 |
| **භූමිය :** | | | | |
| ක්ෂය කිරීම | 13,808 | | 14,162 | |
| විදුලිය | 5,216 | | 4,227 | |
| වරිපනම් | 2,334 | | 2,334 | |
| රක්ෂණ | 1,208 | | 657 | |
| බදු කුලි | 1,076 | | 1,431 | |
| නඩත්තුව | 980 | | 4,609 | |
| | | 24,622 | | 27,420 |
| **උපකරණ :** | | | | |
| ක්ෂය කිරීම | 9,836 | | 9,118 | |
| නඩත්තුව | 3,310 | | 1,616 | |
| | | 13,146 | | 10,734 |
| **පුස්තකාල පොත් :** | | | | |
| ක්ෂය කිරීම | | 3,423 | | 4,166 |
| **අනිකුත් වියදම් :** | | | | |
| විවිධ | 1,345 | | 806 | |
| බැංකු ගාස්තු | 315 | | 745 | |
| විගණක ගාස්තු | 600 | | 600 | |
| ගමන් ගාස්තු | 518 | | 266 | |
| මුදල් අවලංගු කිරීමෙන් සිදුවූ පාඩුව | 50 | | — | |
| | | 2,828 | | 2,417 |
| ආදයම් ප්‍රකාශයට ගෙන ගිය එකතුව | | 1,81,434 | | 1,61,550 |

**1972.12.31 දිනට පරිත්‍යාග අරමුදල්**

ලැන්ඩර් ත්‍යාග අරමුදල

| | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|
| **වත්කම් :** | වෙළඳ අගය | පොතේ අගය | වෙළඳ අගය | පොතේ අගය |
| සමාගම් කොටස් | 5,062 | 17,905 | 7,175 | 17,905 |
| ස්ථාවර තැන්පතු | 4,586 | 4,586 | 4,485 | 4,485 |
| මුළු ආයෝජන | 9,648 | 22,491 | 11,660 | 22,390 |
| බැංකු ශේෂය | 3,943 | 3,943 | 4,034 | 4,034 |
| එකතුව | 13,591 | 26,434 | 15,694 | 26,424 |
| **අරමුදල :** | | | | |
| 1972.01.01 දිනට | | 26,424 | | 26,131 |
| එකතුකළා : ලැබුණු ශුද්ධ ආදායම් | 710 | | 593 | |
| අඩුකළා : පිරිනැමූ ත්‍යාග | 700 | 10 | 300 | 293 |
| 1972.12.31 දිනට | | 26,434 | | 26,424 |

**සිරිල් ඊ. බෙග්බි අනුස්මරණ අරමුදල**

| | මෙම වර්ෂය | | පසුගිය වර්ෂය | |
|---|---|---|---|---|
| **වත්කම් :** | වෙළඳ අගය | පොතේ අගය | වෙළඳ අගය | පොතේ අගය |
| 5—1/2% රජයේ ණය 1990/94 ... ... ... ... | 6,400 ... | 10,000 ... | 6,330 ... | 10,000 |
| බැංකු ශේෂය ... ... ... ... | 1,411 ... | 1,411 ... | 861 ... | 861 |
| එකතුව ... | 7,811 | 11,411 | 7,191 | 10,861 |
| **අරමුදල :** | | | | |
| 1972.01.01 දිනට ... ... ... ... | | 10,861 ... | | 10,311 |
| එකතුකළා : ශුද්ධ ආදයම ... ... ... ... | 550 | | ... 550 | |
| අඩුකළා : පිරිනැමූ ත්‍යාග ... ... ... ... | නැත | 550 ... | නැත | 550 |
| 1972.12.31 දිනට ... ... ... ... | | 11,411 | | 10,861 |

12-36—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

අංක ඇප්බිර්/1/63.

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—ප්‍රතිශෝධිත ආරෝග්‍යශාලා ගාස්තු**

1972 ජූනි 9 වැනි දින අංක 11 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ 1972 මැයි මස 3 වැනි දින මගේ අංක ඇප්බිර්/1/63 යටතේ 3 (1) වැනි ඡේදයේ පලවුණු අංගොඩ මානසික රෝහල—II පංතියේ "විලාස්" වාට්ටුවක ගෙවන රෝගීන්ගෙන් අයවිය යුතු නේවාසික ගාස්තු පහත සඳහන් අයුරු ප්‍රතිශෝධනය කරනු ලැබේ.

අංගොඩ මානසික රෝහල—II පංතියේ "විලාස්"

වාට්ටුවකට දිනකට රු. 7.50

ඉහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් 1973 නොවැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වනු ලැබේ.

2. ඉහත සඳහන් දැන්වීමේ 3 වැනි ඡේදයේ (iv) අනුව ගෙවිය යුතු තැන්පත් මුදල් ප්‍රමාණය 1973 නොවැම්බර් මස 1 වැනි දින සිට පහත සඳහන් අයුරු ප්‍රතිශෝධනය කරනු ලැබේ.

අංගොඩ මානසික රෝහල—I පංතියේ "විලාස්" වාට්ටුවට රු. 500.00.

අංගොඩ මානසික රෝහල—II පංතියේ "විලාස්" වාට්ටුවකට රු. 275.00.

3. එම දැන්වීමේ 5 වැනි ඡේදය අනුව අංගොඩ මානසික රෝහලේ සියලුම පංතිවල ගෙවන රෝගීන්ගෙන් ඖෂධ සඳහා දිනකට රු. 3.00 බැගින් නොව එම ඖෂධ සපයනු ලබන මිල ප්‍රමාණය අනුව 1972 අගෝස්තු මස 1 වැනි දින සිට අයකරනු ලැබේ.

ඇප්. ඒ. වික්‍රමසිංහ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

ගිණුම් අංශය,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ. පෙ. 584,
කොළඹ,
1973 නොවැම්බර් 7 වෙනි දින.

12-139—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචිකිරීම**

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ශාහුල් හමීඩ් මොහමඩ් සුබෙයිර් ෆාරුක් නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| අංකය | ලියාපදිංචි කිරීමෙ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 1015 ... | 1973.11.26 ... | ජේත් ටැබර්නකල් ... | නිට්ටුවෙල, පින්නවෙල, බලන්ගොඩ ... | ශ්‍රෙස් අරුමනායගම දේව-ගැති | ජේපලෝ ඔෆ් ද ෆ්‍රී චර්චස් ඔෆ් ශ්‍රී ලංකා |

එස්. එච්. ඇම්. එස්. ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්යාලය,
කොළඹ, 1973.11.26.

12-164—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1959 අංක 5 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදයක ආඥා පනත**

1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදයක ආඥාපනත යටතේ පහත දක්වෙන උපලේඛනයේ අංක 1 සහ 2 යන ශිර්ෂයන්හි දක්වෙන ණයකරුවන් හා ණයහිමියන් යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ණය සහනදයක මණ්ඩලය අදහස් කර ඇත.

මේ සඳහා ඒ ඒ ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය පිළිබඳ විස්තර ප්‍රකාශයක් 1973 දෙසැම්බර් මස 13 වෙනි දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ණයහිමියන්ට මෙයින් දන්වනු ලැබේ.

කේ. ඒ. ඩී. බී. කරුණාරත්න,
ණය සහනදයක මණ්ඩලයේ ලේකම්.

කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ,
අංක 33/1, "අමිරා" දරණ ස්ථානයේ පිහිටි,
ණය සහනදයක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ දිය,
1973.11.20.

උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | අංක 1<br>ණයකරුගේ නම සහ ලිපිනය | අංක 2<br>ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 27501 | රණතුංග ආරච්චිගේ ප්‍රේමරත්න රණතුංග, වල්පිටමුල්ල, දෙවලපොල | හීරලුපතිරන්නැහෙලාගේ ජයවතී ප්‍රේමලතා, පමුණුව, මිනුවන්ගොඩ |
| 27052 | වී. ඇම්. සමරසිංහ, 60, ශ්‍රී ඉන්ද්‍රජෝති පාර, රත්මලාන | ඇස්. බී. නන්දසේන, 76, කිව් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 12 |
| 27053 | පිලිප්පු මුහන්දිරමලාගේ කුමරප්පු, උඩුකෝදෙනිය, ආරගොඩ | මොරගල්ලලාගේ චාර්ලිස්, උඩුකෝදෙනිය, ආරගොඩ |
| 27054 | රාජවර්ධන ගෙදර ජිනදස, දීග්ගල්පොත්ත, ඇකිරිය | ආර්. ජී. අප්පුනයිදේ, දීග්ගල්පොත්ත, ඇකිරිය |
| 27055 | එරින් මල්ලිකා උඩුමුල්ල ආරච්චි, සිංහපිටිය, ගම්පොල | ඇල්. ජස්ටින් සිල්වා, කඩවල, දූනාගහ |
| 27056 | එම්. එල්. සාලියා උම්මා, මල්ලවපිටිය, කුරුණෑගල | අබ්දුල් මජීඩ් මකිසම් මොහමඩ් ඉස්මයිල්, මල්ලවපිටිය, කුරුණෑගල |
| 27057 | අබ්දුල් කපූර් මොහමඩ් ජමිල්, 39, තලාපිටිය පාර, ගාල්ල | කොහොබන් ආරච්චිගේ රොබට්සන්, අඩුරන්විල, පෝද්දල |
| 27058 | රණසිංහ ආරච්චිගේ දෙන් බස්තියන්, මහහේන, පාතේගම උතුර, කෝට්ටෙගොඩ | (1) විලේගොඩ ගමගේ කරුණාවතීහාමිගේ, නාගහගෙදර, පාතේගම උතුර, කෝට්ටෙගොඩ, (2) ඉපිටකඩුව ලොකුගමගේ පියදස, දන්දෙනිය, රත්මලේ |
| 27059 | පූරනම් කනගසබාපති සහ කේ. කනගසබාපති, වෙලනෙයි බටහිර, වෙලනෙයි | රාසලෙච්චුමි (කේ. මුත්තයියාගේ වැන්දඹුව) වෙලනෙයි බටහිර, වෙලනෙයි |
| | | පැවරූ අය:—සින්නයියා මුතුතම්බි, වෙලනෙයි බටහිර, වෙලනෙයි |
| 27060 | මුරුගයියා අන්නමලෙයි, 148/8, ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ | (1) මුහන්දිරම්ගේ ඒබ්‍රහම් සැම්සන් රොද්‍රිගු, 564, පානදුර, හොරණ (2) ප්‍රැන්සිස් ලේඩා වී. ද මැල්, ජෝන් විල්සන් පෙරකදෝරු සහ නොතාරිස්, 365, වෙල්ල වීදිය, කොළඹ 12. (3) ඉසබෙලා තංග රත්නම් කුමාරසාමි, 72 1/1, ස්කූල් ලේන්, කොල්ලුපිටිය |
| 27061 | පාලමන්ඩඩිගේ පීටර් ප්‍රැන්සිස් ප්‍රනාන්දු, අංක 128/2 බී, සමාජවාදී නිවහන් පෙදෙස, කොරලවැල්ල, මොරටුව | දෙඹගහපතිරගේ සුනීතා රංජනි පීරිස්, 273, ''සිරිරාජ'', කොරලවැල්ල මොරටුව |
| 27063 | අබ්දුල් කාදර් පාතුමාමලීහා, 86/බී, සර්කියුලර් පාර, හාල්ල | අබ්දුල් ජලීල් හලීමා නොහොත් හලීමා අසීස්, ලෙයින් බෝන් වීදිය, කොටුව, ගාල්ල |
| 27065 | ඉසාකුලෙබ්බෙ වසීලා උම්මා, ජිලානි පාර, ධර්ගානගරය | අලිම් මරික්කාර් මොහමඩ් සුබයාර්, 160, මතුගම පාර, ධර්ගා නගරය |
| 27066 | පන්නිපිටිය අච්චිගේ ඇලිස්නෝනා, 308, ගම්මාපටුමග, මහරගම | පී. පී. පෙරේරා, 43/55, පූර්වාරාම මාවත, කොළඹ 6 |
| 27070 | අකුරන්ගේ අල්ලිස්, පිල්ලඋඩ, හේවාදිවෙල | රත්තිරන්ගේ මාටින්, මහගම, හේවාදිවෙල |
| 27071 | පාවුලුගේ පීතර ප්‍රනාන්දු, පොල්වත්ත, මිනුවන්ගොඩ | පාවුලුගේ ජිනදස, පොල්වත්ත, මිනුවන්ගොඩ |
| 27072 | මාත්ගමුවේගෙදර දෙන් ජස්ටින් අප්පු, තැපැල්හල, වහකෝට්ටෙ | මාත්ගමුවේ ගෙදර දෙන් ප්‍රේදුරු අප්පු, කැරකොප්පුව අසල, පිහිල්ල යාය, වහකෝට්ටෙ |
| 27073 | ගම්පලගේ සීලවතී, මුල්ලැලියගොඩ, පරදූව, අකුරැස්ස | සෝමදස උක්වත්ත ලියනගේ, 108, රාහුල පාර, මාතර |
| 27075 | කුමාරපේලි ආරච්චිගේ දෙන් රොබියස්, ''මිල්විව්'', උඩුපිල, දෙල්ගොඩ | හිරලු ආරච්චිගේ චාර්ලිස් ප්‍රේරා, බියගම, බියගම තැපැල් |
| 27076 | බමුණු ආරච්චි පතිරගේ ඩේවිඩ් අප්පුහාමි, 512, නාරන්ගොඩ පාලුව, බටුවත්ත | ඉලන්දාරි දේවගේ ජිනෝරිස්, වල්පොල, රාගම |
| 27078 | ලේකමලාගේ උදුමාන් ලෙබ්බෙ, නො. 11, මඩවල පාර, කටුගස් තොට | (1) ආර්. බී. අත්තනායක, ඇම්. ඩී. ඇම්. අබේසිංහ බණ්ඩා බාරේ, පේරවංගුව, හගුරන්කෙත. (2) ඒ. සී. ඇස්. හමීඩ්, 9/1, ආදහන මලුව පාර, මහනුවර |
| 27079 | උපතිස්ස වික්‍රමරත්න සිරිවර්ධන, කොටකෙල්ල, වල්ගම දකුණ, මාතර | ලලිතා කරුණාසේන, හේන, දික්වැල්ල |
| 27081 | කලුබෝවිලගේ කරුණාවතී අල්විස්, 144, හෙට්ටියාවත්ත, අංගොඩ | ඇස්. වීරතුංග, 494/1, කෝට්ටෙ පාර, පිටකෝට්ටෙ, කෝට්ටෙ |
| 27082 | වැලිකලගේ රොස්ලින් ප්‍රේරා, 20/ඒ, දෙවෙනි පටුමග, නාවල පාර, රාජගිරිය | නානායක්කාර වසන් අග්‍රිගේ ඇල්බට් නානායක්කාර, 104/7, ශ්‍රී සංඝ රාජ මාවත, මරදන |
| 27083 | උක්වත්තහේවගේ සැමුවෙල්, 140, හපුගොඩ, කඳාන | වයි. එච්. සී. වික්‍රමසිංහ (නොහොත් සී. වන්නිආරච්චි), 'වික්‍රමවිලා', අගලිය, බද්දේගම |
| 27084 | අයිවි හෙලන් පෙරේරා (විවාහයට පෙර ගුණතිලක,) 406, කෙලින් වීදිය, මීගමුව | වර්ණකුලසීරිය සයිමන් කුඤ්ඤ, නො. 52, කොප්පර හන්දිය, මීගමුව |
| 27086 | වෙදරාලලාගෙදර දෙස්තර මොහමඩ් නූර්දීන් රන්ජන්, දෙහිඅංග, ගහපළාත, යටිනුවර, මුරුතලාව | රත්නායක මුදියන්සේලාගේ අබේරත්න, වකුරකුඹුර, මැද පළාත, යටිනුවර, මුරුතලාව |
| 27087 | තොටගමුව විදනගේ සනෝරිස් පෙරේරා, 593ඒ, කොළඹ පාර, ගිංතොට | චාර්ල්ස් සේනාරත්න, පියදිගම, ගිංතොට |
| 27089 | දෙඩම්පහලගේ පර්ලි අයිරින් ප්‍රනාන්දු, නො. 38, ඉහල ඉඩිබැද්ද, මොරටුව | කුරුකුලසූරියගේ ඇම. ඇග්නස් පෙරේරා, නො. 55, ඉහල ඉඩිබැද්ද, මොරටුව |
| 27090 | මුදියන්සේලාගේ චාර්ල්ස්, 317/11, ගෝනහේන, කඩවත | ජයදේව සෙනෙවිරත්න, 155, මැසෙන්ජර් වීදිය, කොළඹ 12 |
| 27091 | රන්හොටිගෙදර බබානිස්, ඊරියගොල්ල, කවුඩුපැලැල්ල, මාතලේ... | පසික්කු හෙන්නෙදිගේ දවිත් ද සිල්වා, මඩවල, උල්පත, මාතලේ |
| 27092 | ඇත්තිලිගොඩ විදනගමගේ උර්දියස්, පොල්කන්ද, ලනුමෝදර, හබරාදූව | පොල්වත්ත ගාල්ලගේ සිරිසේන, කටුකුරුන්ද, හබරාදූව |
| 27093 | අතුකෝරළගේ දෙන් කුලතුංග, ඉහලයාගොඩ, ඉඹුල්ගොඩ | ජයසූරිය ආරච්චිගේ දෙන් ජෝශප් පීටර් ජයසූරිය, ඉහළයාගොඩ, ගම්පහ |
| 27095 | උදුමාන් ලෙබ්බෙ මරික්කාර් වාහිඩ් සහ අබ්දුල් සමීන් පාතිමා නිලීපා, 410, ගාලුපාර, හොරේතුඩුව, මොරටුව | අල්වින් ජෝශප් ප්‍රනාන්දු, '' ලූසිටන්,'' උස්වත්ත, මොරටුව |
| 27098 | බෙනරගම විදනලාගේ ඉන්ද්‍රාදේවි පෙරේරා (නොහොත් ද සිල්වා), වත්තලයාවත්ත ගෘෂ්, නෙහින්න, දෙඩන්ගොඩ | අන්තෝනි ජස්ටින් රාජේන්ද්‍රන් ප්‍රනාන්දු, 128, පිකරින්ස් පාර, කොළඹ 13 |
| 27100 | අහංගම ගාල්ලගේ දයා අමරදස, එපිටවත්ත, වෙලේගොඩ, මාතර... | පොල්වත්තේ ගාල්ලගේ මාටින්, 46, යෙහියාමාතව, ඉසදීන් නගරය, මාතර |
| 27101 | එච්. පී. සිරිපිනා, අංක 116, පිංචිකොටුව වත්ත, ගොඩිගමුව, උස්සා පිටිය | ඩී. පී. ප්‍රේමසාර මුදලාලි, ගොඩිගමුව, පොල්අඹේගොඩ, උස්සාපිටිය |
| 27104 | සුබෙ ආයුලාගේ මනුවෙල් ප්‍රනාන්දු, 154/13, ශාන්ත ජෝශප් වීදිය, මීගමුව | සිංහල ගුරුනාන්සේලාගේ එඩ්මන් ජෝශප් පෙරේරා, 314, කොළඹ පාර, මීගමුව |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 27105 ... | ජයකොඩි ආරච්චිගේ දෙන් විලියම් ජයකොඩි, කිරිකිත්තමුල්ල, යක්කල | ගමඇතිගේ ඔස්ටින් පීරිස් විසින් පවරන ලද අයවන ඩබ්ලිව්. ඒ. ඩී. ආර්. වික්‍රම ආරච්චි, ''මිතිල නිවස, '' කිරිකිත්තමුල්ල, යක්කල |
| 27106 ... | සුබ්‍රමානියම් නඩරාජා සහ භාර්‍යාව මහේස්වරි, 'මහේසවාස', කොකුවිල් හන්දිය, කොකුවිල් | සුබ්‍රමානියම් රෙන්ගනාදන් සහ භාර්‍යාව පංචරත්නම්මා, අරලිනැගෙනහිර, යාපනය |
| 27107 ... | ජයකොඩි ආරච්චිගේ විලියම් සිංඤෝ, පරණගම, උඩුබද්දාව ... | ජයසිංහ ආරච්චිල්ලාගේ සෝමසේන, පරණගම, උඩුබද්දාව |
| 27109 ... | සන්මුගම් තිරුවෙල්ලම්, නො. 41, බාබර් වීදිය, කොළඹ 13 ... | (1) වල්ලිමුත්තු (තිල්ලයම්පලම්ගේ වැන්දඹුව), (2) නාගේස්වරී (අරුනාසලම් ත්‍යාගරාජාගේ භාර්‍යාව), වඩ්ඩු නැගෙනහිර, සිතන්කර්නි |
| 27110 ... | අයි. ඇම්. ලොකුමැණිකා සහ එච්. ඇම්. පොඩිමැණිකා, ඊරිමින්න, කහපත්වල | දිවාකර මොහට්ටාල්ලාගේ නොහොත් නායකරත්න මුදියන්සේලාගේ කමලාවතී, වටරැක, ඉහුරුවත්ත |
| 27112 ... | ගමගේ බෙබිනෝනා, වේරහැර, ගල්හේනවත්ත ... ... | ගලගම පතිරගේ කරෝල්ස්, 301, රජයේ නිවාස, වේරහැර, බොරලැස්ගමුව |
| 27113 ... | වගවත්ත ලියනගේ අයිරින් පෙරේරා, 194, කුඩාබුත්ගමුව, අංගොඩ | කන්දඋඩගේ සුනන්ද, 35/7, සිලරත්න පටුමග, කොළඹ 9 |
| 27114 ... | කෝද්දගොඩ හිටිගේ ඇලිස්නෝනා, '' ගංගාදිසි'', හැගොඩ, බූස්ස ... | ඩී. ඩී. වීරසේකර, හැගොඩ, බූස්ස |
| 27115 ... | ඇල්. ඩී. ඇල්. අබේසේකර සහ ඇල්. ඩී. ඇම්. අබේසේකර, 100, උද්‍යාන පාර, කොළඹ 5 | ටී. පී. සී. කැරොන්, බෙන්යන්ලොජ්, මීගමුව |
| 27118 ... | (1) හෙනරත් පතිරන්නැහෙලාගේ නිරොලිස් අප්පුහාමි, (2) හෙට්ටි ආරච්චිකැන්නැහෙලාගේ ඩිංගිරි මහත්තයා, අඹගල, වරකාපොල | දෙල්ගොල්ලලාගේ අගෝනිස් විල්සන්, නැවිගල, වරකාපොල |
| 27119 ... | ජිම් විල්ප්‍රඩ් සමරසිංහ, වල්ලැහව, කල්එළිය ... ... | ලොකුවිතාන පතිරන්නැහෙලාගේ ගුණරත්න මැණිකේ, පස්යාල |
| 27120 ... | කලුආරච්චිගේ ජොසිනෝනා, 128, කොස්වත්ත පාර, නාවල, රාජගිරිය | ඩී. ජී. සිරිසේන, ගලහිටිකන්ද, දෙහිඕවිට |
| 27121 ... | එදිරිසිංහගේ දෙන් ඩයස්, පානළුව, මීගොඩ ... ... | ගල්ගමුවගේ ඩේවිඩ් සිංඤෝ, අවුපොලමුල්ල, පානළුව, මීගොඩ |
| 27125 ... | වැලිගමගේ ඇල්බට් එමිල්, 346, නාවල පාර, රාජගිරිය ... | ඩබ්ලිව්. බී. ඇස්. බොතේජු, 28 ද සිල්වා පාර, කළුබෝවිල |
| 27126 ... | මහගම විදනෙලාගේ දෙන් මාටින් ගුණරත්න, ශ්‍රී සෝමපාල මාවත, බෝපිටිය, මතුගම | (1) පන්නිල විතානගේ ඩිම්නෝනා, බෝපිටිය, මතුගම, (2) ගමගේ දෙන් ලෙයාර්ස්, කඩවත, පාත්කිය, මතුගම |
| 27130 ... | බූස්සේ රේවත ස්ථවිර, වාලුකාරාමය, දඩල්ල, ගිංතොට ... | (1) කේ. රානිස්හාමි, සමරයාය, කදුරුපේ, බූස්ස, (2) කේ. සෝමවතී, කෝස්විච්, කැදලපාර, බූස්ස |
| 27133 ... | හෙට්ටිආරච්චිගේ ආනමරිහාමි, අම්බලයාය, කටාන ... | ජයසූරිය ආරච්චිගේ සන්තියාගු අප්පුහාමි, කඩවල, කටාන |
| 27134 ... | ඇග්නස් ප්‍රගේසම, වලළුවත්ත, පැල්මඩුල්ල ... ... | ඇස්. පී. සිදම්බරම්, රංජන ස්ටෝර්ස්, 52, බංගසාල වීදිය, කොළඹ 11 |
| 27135 ... | මුතුසාමි කන්දයියා සහ භාර්‍යාව කනගේස්වරී, තිරුනවැලි නැගෙනහිර, සින්නමුතුතම්බි විද්‍යාලයය අසල, යාපනය | විනාසතම්බි සීනිරාසා සහ භාර්‍යාව නිලගවතී, තිරුනවැලි නැගෙනහිර, සින්නමුතුතම්බි විද්‍යාලය අසල, යාපනය |
| 27138 ... | හේවා කන්තිරිගේ සයිමන් පෙරේරා, 146, උඩුමුල්ල, මුල්ලේරියාව, අංගොඩ | ලොකු ගෝනදූවගේ යහෝනිස් පෙරේරා, උඩුමුල්ල, මුල්ලේරියාව, අංගොඩ |
| 27139 ... | ඇම්. බුද්ධදාස ද කොස්තා, 29, ශ්‍රී සිද්ධාර්ථ දෙවට, කිරුලපොන, කොළඹ 5 | මහින්ද ජයදාස සෙනෙවිරත්න, 155, මැසෙන්ජර් වීදිය, කොළඹ 12 |
| 27140 ... | හපුගහගේ සුගතදාස, මක්කානිගම, පන්විල ... | ගිරාබෙගෙදර ධර්මසේන සමරසිංහ, '' තේවත්තේ නිවස'', වාවින්න, වත්තේගම |
| 27142 ... | විමලාවතී බෝගොඩ නැතහොත් වනිගසේකර, මැටරඹ, උණවටුන | දපනෙදුරගේ මාටින්, කෝරලහේවත්ත, මැතරඹ, උණවටුන |
| 27143 ... | වන්නි අච්චිගේ සුමනදාස පොන්සේකා, 18, භාතිය මාවත, කළුබෝවිල, දෙහිවල | ඩී. ආර්. පොන්නයියා, 8, ස්ටේසන් පටුමග, නුගේගොඩ |
| 27146 ... | එස්මි සෙනෙවිරත්න, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මීගමුව ... | ඒ. රාමනාදන්, ආර්. දේවසේනාපති බාරේ, 16, කින්රෝස් ඇවනිව්, කොළඹ 4 |
| 27147 ... | කාලවිල විතානගේ දෙන් සිරිපාල, නවුන්තුඩුව, කටුගහහේන ... | විල්ආරච්චිගේ දෝන ඇසිලින් ගුණතිලක, '' ගාමිණී නිවස'', අදිකාරිගොඩ, ධර්ගා නගරය |
| 27150 ... | එච්. ටී. තේනුවර, 31/1, කෙහෙල්වත්ත පාර, ගම්පොල ... | ස්ටෑන්ඩර්ඩ් ජීවිත සහතික සමාගම, 39, වැකැම්වීදිය, කොළඹ |
| 26963 ... | හික්කඩුව ලියනගේ සුගතදාස, මලවැන්න, තෙල්වත්ත ... | වලිමුනි ලැන්ට්ස් සිල්වා, බේරුවල, මොරගල්ල |
| 27293 ... | හේවා බෝරුප්පගේ සුමනාවතී, '' සුදර්මා'', පිටිබැද්දර, දෙහිගස්ප... | (1) සැමුවෙල් වික්‍රමසිංහ, පිංවත්ත, අකුරැස්ස, (2) ඊ. ජේ. ගුණවර්ධන, දලවල්ලාගොඩ, දෙහිගස්ප, පිටිබැද්දර, (3) ඇස්. එම්. සීටින්, දෙහිගස්ප, පිටිබැද්දර |
| 27429 ... | අමරසිංහ වයිමන්, 525/1, වැව පාර, බොරලැස්ගමුව ... | ලියනආරච්චිගේ උපාසක අප්පු, අංක 72, මල්වත්ත පාර, කොළඹ 11 |
| 27499 ... | තේව හෙට්ටිගේ බර්ලින්, 73/1, දුටුගැමුණු වීදිය, කළුබෝවිල, දෙහිවල | සතරසිංහ ආරච්චිගේ ධර්මදාස, අංක 245, පමුණුව, මහරගම |
| 27500 ... | මොහොමඩ් සාලි උම්මු ජෙසීමා, අංක 79, නුවරපාර, තිහාරිය, කලගෙඩිහේන | කේ. ඒ. විමලසේන, දඩගමුව, වේයන්ගොඩ |
| 25486 ... | වලිමුනිදේවගේ ආරියදාස සහ බී. සෝමවතී ගුණරත්න, නො. 219, මහර නුගේගොඩ, රාගම | එම්. ලිවිනිස් සිංඤෝ (මියගොස්), **උරුමක්කාරි :** හෙට්ටිආරච්චිගේ එමිනෝනා, 220/බී, මහර නුගේගොඩ, රාගම |
| 27273 ... | බත්තනමුදියන්සේලාගේ ජයතිලක බණ්ඩා, '' ජයම්පති'', මීවල දෙනිය, හන්දෙස්ස | අත්තනායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා, කඹුරාදෙනිය, හන්දෙස්ස |

12-40—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

කෑ/විද්‍යා මංගල පිරිවෙන—මංගලගම, මොලගොඩ—අස්ථිර වශයෙන් ලියාපදිංචි කිරීම

ඉහත නම් සඳහන් පිරිවෙන 1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස අස්ථිර වශයෙන් ලියාපදිංචි කල බව මෙයින් දන්වමි.

ඩී. බී. මල්ලිකාරච්චි,
කෑගල්ල ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ.

මගේ අංකය : කෑ/පපාඋ/84,
1973 නොවැම්බර් මස 21 වැනි දින,
කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

12-6—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

අංක 453

**1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

**2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව**

1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති (''ඒකාබද්ධ වන සමිති'' යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති (''ප්‍රධාන සමිතිය'' යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමඟ 1973.12.14 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1973.11.27 දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

**පළමුවෙනි උපලේඛනය**

**ඒකාබද්ධ වන සමිති :**

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත කිණිගම කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි 91 ... | 1971.03.05 |
| 2. | සීමාසහිත කරඳාපත්තු කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි 92 ... | 1971.03.05 |
| 3. | සීමාසහිත යගම්පත්තු කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි 93 ... | 1971.03.05 |
| 4. | සීමාසහිත උඩුබද්දව විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි 94 ... | 1971.03.06 |

**දෙවෙනි උපලේඛනය**

**ප්‍රධාන සමිතිය :**

| සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|
| සීමාසහිත බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි 116 ... | 1973.11.24 |

**12–170—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය**

---

**කතරගම මහා දේවාලයේ ඇල්මහ උත්සවය**

**1973 දෙසැම්බර් 08, 09 සහ 10**

**දැනට රටේ පවතින කොලරා රෝගය නිසා ඉහත සඳහන් උත්සවය මෙම වර්ෂයේ දී නොපැවැත්වෙන බව මහජනයාගේ දැනගැනීම සඳහා නිවේදනය කෙරේ. මේ සම්බන්ධව 1973. 11. 09 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම අවලංගු කරමි.**

**ඇස්. ජේ. සුමණසේකර බණ්ඩා,**
**මොණරාගල දිසාපති.**

**1973. 11. 27,**
**දිසාපති කාර්යාලය,**
**මොණරාගල.**

**12–167—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය**

---

**(LE. 586)** මගේ අංකය : නීති/ණ/1020

**ජාතික නිවාස දෙපාර්තමේන්තුව**

**උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡෙදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම**

ජාතික නිවාස ආඥාපනතේ අංක 9 (1) බී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන පනත් යටතේ පත්කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන යූස්ටස් ඩෙනිස්ටන් මැල්කම් සමරක්කොඩි වන මම ශ්‍රී ලංකා ජනරජය සඳහාත් වෙනුවෙනුත් ක්‍රියා කරමින්, ඇස්. පී. විජයතිලක ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරණ ලද 1966.8.14 දින අංක 33461 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර ඇති බැවින්, මාතලේ දිසාපති කාර්යාලයේ, ලයනල් ආරියරත්න ඒකනායක මහතාගෙන් 1972.8.31 දිනතෙක් අයවිය යුතු රුපියල් දහත්දහස් පන්සිය හැටදෙකයි ශත තිස්පහ (රු. 17,562.35) 1972.6.23 දිනට පසු ගෙවන ලද මුදල් හැර අයකර ගැනීම සඳහාත්, එසේම 1972.8.31 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් දහතර දහ (රු. 14,000)ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට පහමාර ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 1972.8.31 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමඟ අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම් සහ එයට අදල සියළුදේත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා, නිකුත් කර, එසේ විකිණීම සඳහා මහනුවර අස්ගිරියේ, ධම්මසිද්ධි මාවතෙහි, අංක 66හි, කේ. එඩ්මන්ඩ් පෙරේරා ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

ඇම්. සමරක්කොඩි,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2, 1973 ජූලි මස 19 වැනි දින.

**පළමුවැනි උපලේඛනය**

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ කොහොන්සිය පත්තුවේ පුරිජ්ජල පිහිටි බලපත්‍රධාරි මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් සම්පාදිත 1962 මැයි 1 වැනි දින අංක 2892 පිඹුරට අනුව එකට ගැනෙන්නාවූ ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2 රූ. 0 පර්. 0) අන්තර්ගත 9 සහ 10 කට්ටිලින් එනම් එකී දකුණු මාතලේ කොහොන්සිය පත්තුවේ පුරිජ්ජල හලන්ගොඩ සහ වරකමුරේ ගම්වල පිහිටි වරකමුරේවත්තේ 6 කට්ටියෙන් බෙද වෙන් කළ කොටසක්වූ ප්‍රමාණයෙන් අක්කර එකක් (අ.1 රූ.0 පර්.0) වූ 10 කට්ටියේ සියල්ල, පුරිජ්ජල පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක්වූ (මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී 241/87 හි ලියාපදිංචි කර ඇති) එකී අංක 2892 පිඹුරට අනුරූපව උතුරට කොටුවේ ගොඩවත්තෙන්ද නැගෙනහිරට එකී පිඹුරේ 11 කට්ටිය වශයෙන් දැක්වෙන්නාවූ එම වත්තෙන්ම (වරකමුරේ වත්තේ) කොටසකින්ද දකුණට ගම්සභාව පාරෙන්ද බස්නාහිරට එකී පිඹුරේම 6ේ සහ 9බී කට්ටි වශයෙන් දක්වෙන්නාවූ එම වත්තේම (වරකමුරේ වත්තේ) කොටසින්ද මායිම්වූ එකී ඉඩම කැබැල්ලේ ඉදිකර ඇති නිවාසයත් ඊමත ඇති වැවිල්ලත් සැම දේමත් සහිතව.

**12–222—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය**

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය මාර්ගය හරහා වැටී ඇති හරස් පාර අළුත්වැඩියා කිරීම

ප්‍රධාන දුම්රිය මාර්ගයේ සැ. 78 ද. 63 පුරුක් 97 දරණ ගම්පොල සහ උලපනේ අතර සිංහපිටිය නම් ස්ථානයේ දුම්රිය මාර්ගය හරහා ඇති පාර (ගම්පොල සිට දෙලොස්බාගේ/මාවනැල්ල දක්වා වැටී ඇති පාර) 1973.12.15 වෙනි දින පෙරවරු 07.00 සිට 1973.12.16 දින දක්වා අළුත්වැඩියා කරනු ලබන බැවින් පහත සඳහන් අන්දමට රථ වාහන ගමනා ගමනයට ඉඩදී ඇති බව සලකන්න.

| | |
|---|---|
| 73.12.15 දින පෙ.ව. 07.00 සිට ප.ව. 08.00 දක්වාද<br>73.12.16 දින පෙ.ව. 06.00 සිට ප.ව. 04.00 දක්වාද | මෙම ස්ථානය අඩක් වසා ඇති අතර ප්‍රවේශමෙන් රථවාහන ගමනා ගමනයට ඉඩදී ඇත. |

2. 1973.12.15 දින පස්වරු 08.00 සිට 1973.12.16 දින පෙරවරු 06.00 දක්වා සම්පූර්ණයෙන්ම වසා තබනු ඇත. මෙම කාලය තුළ රථවාහන ගමනා ගමනයට මාර්ගයක් නොමැතිබව ද කරුණාවෙන් සලකන්න. ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් මගීන් මාරුකිරීම සඳහා කටයුතු සලසා ගත යුතුය.

ජේ. පී. සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

12–254—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

මාතර දුම්රියස්ථාන අංගනයේ සැතපුම 98 දම්වැල් 40 ස්ථානයේ බතුතා පාරේ දම්වැල් 28 ස්ථානයේ ඇති හරස් මාර්ග දෙක 73.12.22 දින පෙරවරු 7.00 සිට 73.12.23 දින පස්වරු 6.00 දක්වා අළුත්වැඩියා කරනු ලැබේ.

මෙම හරස් මාර්ගයන් 73.12.22 දින පෙරවරු 9.00 සිට පස්වරු 6.00 දක්වා සහ 73.12.23 දින පෙරවරු 6.00 සිට පස්වරු 2.00 දක්වා අර්ධ වශයෙන්ද 73.12.22 දින පස්වරු 6.00 සිට 73.12.23 දින පෙරවරු 6.00 දක්වා සම්පූර්ණයෙන් ද සියළුම රථවාහන සඳහා වසා තබනු ලැබේ.

සම්පූර්ණයෙන් වසා ඇති කාල සීමාව තුළ සියළුම රථවාහනවලට මාතර—නූපෙ හරහා අකුරැස්ස මාර්ගය හා වල්පොල—හක්මන මාර්ගය පාවිච්චි කළ හැක,

ජේ. පෝල් සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

12–253—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. **පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| කනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | පිටරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| එක් කොටසක් ... ... ... | 46 0 ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

*** කනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටයක් ... ... | 0 50 ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 60 ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ කනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12.07 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.